# 5 ශ්‍රේණිය

# මූලික පිරිවෙන්

# පාලි භාෂාව

## මධ්‍ය හා අවසන් වාර ප්‍රශ්න පත්‍ර

## Mid Term  and Year End Papers

**මූලික පිරිවෙන් මධ්‍ය හා අවසාන වාර ප්‍රශ්න පත්‍ර i-ii**



මූලික පිරිවෙන් පාලි භාෂාව මධ්‍ය වාර හා අවසන් වාර පසුගිය ප්‍රශ්න පත්‍ර

# පාලි

## මධ්‍ය වාර ප්‍රශ්න පත්‍ර - **5** ශ්‍රේණිය



| | |
|---|---|
| සියලු ම හිමිකම් ඇවිරිණි<br>All Rights Reserved | # මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2018<br>## Primary Piriven Mid Term Test - 2018<br>05 වසර / Grade 05 |

**පාලි - I**
**PALI - I**

කාලය : පැය එක යි
Time : One Hour

❖ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 1 බැගින් 40 කි.

❖ අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

❖ ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරා ගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

1. පාලි අක්ෂර මාලාවේ අඝෝෂාක්ෂර සංඛ්‍යාව
   i. 10කි. ii. 11කි. iii.12කි. iv.21කි.

2. ය ර ල ව අක්ෂර හඳුන්වන නාමයක් නොවන්නේ
   i.ස්පර්ශාක්ෂර ii.අන්තඃස්ථාක්ෂර iii.ද්වියාක්ෂර iv.ඊෂත්පෘෂ්ට

3. සමාන නාම විභක්ති ප්‍රත්‍යයන් යෙදෙන විභක්ති දෙක සඳහන් වරණය වන්නේ
   i.දුතියා තතියා ii.තතියා චතුත්ථී iii.චතුත්ථී ඡට්ඨී iv.ඡට්ඨී සත්තමී

4. සර්වනාම ශබ්ද පමණක් ඇතුළත් වරණය වන්නේ
   i.අඤ්ඤ අඤ්ඤතර අසුර ii.කතර කතම ඉතර
   iii.එක එත නග iv.අම්හ තුම්හ බ්‍රහ්ම

5. ති හා චතු ශබ්ද වරනැඟීම සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ
   i. ඒකවචන බහුවචන දෙක්හිම වරනැගිය හැකිය.
   ii. ලිංග තුනට වෙනස්ව බහුවචනයේ පමණක් වරනැගිය හැකිය.
   iii. ලිංග තුනටම සමානව බහුවචනයේ පමණක් වරනැගිය හැකිය.
   iv. ස්ත්‍රීලිංගයේ බහුවචනයේ පමණක් වරනැගිය හැකිය.

6. සමානාර්ථ පද යුගලයක් නොවන්නේ
   i. ද්වාවීසති බාවීසති ii.තෙරස තෙළස
   iii.ඡබ්බීසති ඡත්තිංසති iv.පඤ්චදස පණ්ණරස

7. දසසු පුරිසෙසු පඨමො ජෙකො භවති යන වැකියෙහි අංකිත පදයේ විභක්ති ප්‍රයෝගය වන්නේ
   i. කාලාර්ථයේ සත්තමී විභක්තියයි.
   ii. භාවාර්ථයේ සත්තමී විභක්තියයි.
   iii. ආධාරාර්ථයේ සත්තමී විභක්තියයි.
   iv. නිර්ධාරණාර්ථයේ සත්තමී විභක්තියයි.

8. භගවතො............... මහාපුරිසලක්ඛණා හොන්ති යන වැකියෙහි හිස් තැනට වඩාත් උචිතපදය වන්නේ
   i.ද්වත්තිංසති ii.චත්තාළිසති iii.අසීති iv.චතුරාසීති

9. ක්‍රියා ප්‍රවර්ගාර්ථයේ තතියා විභක්ති ප්‍රයෝගය සඳහා නිදසුනක් වන්නේ
   i. තෙන සමයෙන භගවා ජෙතවනෙ විහරති.
   ii. සාමි දාසෙන කම්මං කාරෙති.
   iii. කුමාරො රථෙහි නගරං ගච්ඡති.
   iv. ථෙරා නවහි මාසෙහි සංගීතිං අකංසු.

10. ත්‍රිපිටකය පුස්තකාරූඪ කරන ලද්දේ
i. දෙවානම්පියතිස්ස රජු දවසය. ii. වළගම්බා රජු දවසය.
iii. දුටු ගැමුණු රජු දවසය. iv. පරාක්‍රමබාහු රජු දවසය.

11. ඛුද්දක නිකායට අයත් නොවන ග්‍රන්ථයක් ඇතුළත් වරණය වන්නේ
i. ඛුද්දකපාඨ ධම්මපද උදාන
ii. ථෙරගාථා ථෙරීගාථා ජාතක
iii. නිද්දෙස පටිසම්භිදාමග්ග අපදාන
iv. චරියාපිටක පෙටකෝපදෙස සුත්තනිපාත

12. උදානපාළියේ ඇතුළත් සූත්‍ර සංඛ්‍යාව වන්නේ
i.80කි. ii.82කි. iii.70කි. iv.95කි.

13. ආයන්තිං නාභිනන්දති ..............න සොචති යන්නෙහි හිස්තැනට යෙදිය යුතු වචනය වන්නේ
i.නික්ඛමන්තිං ii.පක්කමන්තිං iii.සංකමන්තිං iv.නායන්තිං

14. තදඤ්ඤං..............නිකායො..............මතො යන පාඨයේ හිස්තැන සඳහා යෝග්‍ය පද යුගල වන්නේ
i.ධම්මං විනයං ii.බුද්ධවචනං ඛුද්දකො
iii.ගන්ථං ඛුද්දකො iv.පිටකං අභිධම්මං

15. අපදානපාළියේ ඇතුළත් අපදාන සංඛ්‍යාව
i.592කි. ii.500කි. iii.40කි. iv.550කි.

16. මහා ප්‍රජාපතිථෙරී අපදානයෙහි ගාථා සංඛ්‍යාව
i.120කි. ii.190කි. iii.200කි. iv.290කි.

17. භික්ඛුනීනිලයො යනු
i. භික්ෂුණීන්ගේ තනතුරකි. ii.භික්ෂුණීන්ගේ ආරාමයකි.
iii. භික්ෂුණීන්ගේ සිවුරකි. iv.භික්ෂුණීන්ගේ පරපුරකි.

18. මහාප්‍රජාපතී ගෝතමිය සමග පිරිනිවි භික්ෂුණීන්ගේ ගණන වන්නේ
i.100කි. ii.500කි. iii.1000කි. iv.5000කි.

19. මහාප්‍රජාපතී ගෝතමී තෙරණිය පිරිනිවන් පාන බව බුදුරදුන්ට දැන්වූයේ
i.සැවැත්නුවර දී ii.රජගහනුවර දී
iii.කපිලවස්තුපුරයේ දී iv.විශාලා මහනුවර දී

20. ත්වම්පි සමණ <u>කසස්සු</u> ච <u>වපස්සු</u> ච යන වැකියෙහි අංකිත පදවල ආඛ්‍යාත විභක්තිය වන්නේ
i.වත්තමානා ii.සත්තමී iii.පඤ්චමී iv.අජ්ජතනී

21. පරිකල්පාර්ථය ප්‍රකාශ කරන ක්‍රියා විභක්තිය වන්නේ
i.පඤ්චමී ii.කාලාතිපත්ති iii.සත්තමී iv.අජ්ජතනී

22. ඉමං භික්ඛං භික්ඛුසඞ්ඝස්ස දෙම යන වැකියෙහි උක්තපදය විය යුත්තේ
i.භික්ඛං ii.මයං iii.ඉමං iv.භික්ඛුසඞ්ඝස්ස

23. අසවර්ණාදේශය නියම කෙරෙන බාලාවතාර සූත්‍රය වන්නේ
i.ක්වචාසවණ්ණං ලුත්තෙ ii.ඉවණ්ණො යං නවා
iii.වමොදුදන්තානං iv.වග්ගන්තං ච වග්ගෙ

24. බාලාවතාරයට අනුව ප්‍රධාන සන්ධි ප්‍රභේද
i.4කි. ii.5කි. iii.3කි. iv.2කි.

25. පච්චන්තං යන්නේ නිවැරදි විසන්ධිය
i.පති + අන්තං ii.පච්ච + අන්තං iii.පච් + අන්තං iv.පච්ච් + අන්තං

26. පාලිභාෂාවේ උපසර්ග පද ගණන වන්නේ
i.20කි. ii.22කි. iii.30කි. iv.40කි.

27. උපසර්ගයන්ගේ කාර්යයක් නොවන්නේ
i.ධාතුවේ අර්ථයට බාධා කිරීම ii.ධාතුවේ අර්ථයට අනුකූලවීම
iii.ධාතුවේ අර්ථය විසිතුරු කිරීම iv.ධාතුවෙහි අර්ථයක් නැති කිරීම

28. ආමන්ත්‍රණවාචී නිපාත පදයක් නොවන්නේ
i.ජෙ ii.අරෙ iii.හන්ද iv.අම්භො

29. පාලි භාෂාවේ ක්‍රියා විශේෂණ පද යෙදෙන්නේ
i.දුතියා හා තතියා විභක්තිවලිනි. ii.චතුත්ථී හා ඡට්ඨී විභක්තිවලිනි.
iii.ඡට්ඨී හා සත්තමී විභක්තිවලිනි. iv.පඨමා හා දුතියා විභක්තිවලිනි.

30. ප්‍රශ්නවාචී නිපාතයක් නොවන්නේ
i.කච්චි ii.කතර iii.කථං iv.කතිධා

31. සහ සද්ධිං සමං යන නිපාතපද
i.දුතියා විභක්තිය සමග යෙදේ. ii.තතියා විභක්තිය සමග යෙදේ.
iii.චතුත්ථී විභක්තිය සමග යෙදේ. iv.පඤ්චමී විභක්තිය සමග යෙදේ.

32. පාලිභාෂාවේ ඇති ධාතුගණ සංඛ්‍යාව
i.4කි. ii.6කි. iii.7කි. iv.8කි.

33. උල්ලිඛාපෙති යන්නෙහි අර්ථය වන්නේ
i.අකුරු ලියවයි. ii.හුණු ගාවයි. iii.කොණ්ඩය පීරවයි. iv.රැවුල කප්පවයි.

34. ආභිදොසිකං කුම්මාසං යන්නේ අර්ථය වන්නේ
i.පිළුණු පිට්ටු ii.කුණු වූ එළමස් iii.පිළුණු කිරිබත් iv.කුණුමස්

35. භගවා තායං වෙලායං ඉමං උදානං උදානෙසි අංකිත පදයේ විභක්ති ප්‍රයෝගය වන්නේ
i.අත්‍යන්ත සංයෝගයේ දුතියා ii.කාලාර්ථයේ දුතියා
iii.කාලාර්ථයේ සත්තමී iv.භාවාර්ථයේ සත්තමී

36. සම්මදෙව යන සන්ධියේ රීතිය දැක්වෙන සූත්‍රය වන්නේ
i.මදාසරෙ ii.යවමදනතරලා චාගමා iii.වග්ගන්තං වා වග්ගෙ iv.සරා සරෙ ලොපං

37. දොරපොල්ල යන අර්ථය දෙන පාලි පදය වන්නේ
i.ද්වාරබාහං යන්නයි. ii.අග්ගලසූචිං යන්නයි.
iii.ද්වාරකොට්ඨකං යන්නයි. iv.බහිද්වාරං යන්නයි.

38. ඒකාන්තයෙන් යන තේරුම රහිත නිපාතය වන්නේ
i.හවෙ ii.නූන iii.වත iv.ආසු

39. උපසර්ග පදයක් රහිත පදය තෝරන්න
i.පභවති ii.ඔකාස iii.පිදහති iv.පිබති

40. යාවජීවං යනු
i.සන්ධියකි. ii.සමාසයකි. iii.තද්ධිතයකි. iv.කිතකයකි.

***

# මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2018

## Primary Piriven Mid Term Test - 2018

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

05 වසර / Grade 05

පාලි - II
PALI – II

කාලය : පැය තුන යි
Time : Three Hours

I කොටසටත් II කොටසින් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

### I කොටස

1. (අ) පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා සඞ්ගාමජි සාවත්ථිං අනුප්පත්තො හොති භගවන්තං දස්සනාය. අස්සොසි ඛො ආයස්මතො සඞ්ගාමජිස්ස පුරාණදුතියිකා අය්‍යො කිර සඞ්ගාමජි සාවත්ථිං අනුපත්තො'ති. සා දාරකං ආදාය ජෙතවනං අගමාසි. තෙන ඛො පන සමයෙන ආයස්මා සඞ්ගාමජි අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසින්නො හොති. අථ ඛො ආයස්මතො සඞ්ගාමජිස්ස පුරාණදුතියිකා යෙනායස්මා සඞ්ගාමජි තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං සඞ්ගාමජිං එතදවොච.

(ආ) පහත සඳහන් පද්‍ය සිංහලට නගන්න.

i. නිබ්බානං ගොතමී යාති සතෙහි සහ පඤ්චහි,
නදීසතෙහිව සහ ගඞ්ගා පඤ්චහි සාගරං.

ii. රථිකාය වජන්තිං තං දිස්වා සද්ධා උපාසිකා,
ඝරා නික්ඛම්ම පාදෙසු නිපච්ච ඉදමබ්‍රවුං.

iii. පසීදස්සු මහාභොගෙ අනාථායො විහාය නො,
තයා න යුත්තං නිබ්බාතුං ඉච්චට්ටං විලපිංසු තා.

(ලකුණු 6 + 6 = 12 යි)

2. (අ) පාලියට නගන්න.
   i. උපාසක තෙම භික්ෂූන්ට සිවුරු පූජා කරයි.
   ii. භාග්‍යවතුන් වහන්සේ චතුරාර්ය සත්‍යය ප්‍රකාශ කළ සේක.
   iii. සීතල නැති කිරීම සඳහා සිවුර පරිහරණය කරමි.

(ලකුණු 2 × 3 = 6 යි)

(ආ) ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

අථ ඛො සුදින්නො කලන්දකපුත්තො කතිපාහං බලං ගහෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සුදින්නො කලන්දකපුත්තො භගවන්තං එතදවොච. අනුඤ්ඤාතොම්හි අහං භන්තෙ මාතාපිතූහි අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය. පබ්බාජෙතු මං භගවා ති. අලත්ථ ඛො සුදින්නො කලන්දකපුත්තො භගවතො සන්තිකෙ පබ්බජ්ජං අලත්ථ උපසම්පදං. අචිරූපසම්පන්නො ච පනායස්මා සුදින්නො එවරූපෙ ධුතගුණෙ සමාදාය වත්තති ආරඤ්ඤිකො හොති පිණ්ඩපාතිකො පංසුකූලිකො සපදානචාරිකො අඤ්ඤතරං වජ්ජිගාමං උපනිස්සාය විහරති.

i. පැවිදිවීමට අනුමැතිය ගත යුත්තේ කාගෙන් ද?
ii. අචිරූපසම්පන්නො යන්නෙහි අර්ථය ලියන්න.
iii. සුදින්න තෙර වාසය කළේ කොහි ද?
iv. ධුතාංග ධර්ම 3ක් නම් කරන්න.

(ලකුණු 1 + 1 + 1 + 3 = 6 යි)

## II කොටස

3. (අ) අඝෝෂාක්ෂර කියවෙන බාලාවතාර සූත්‍රය ලියන්න.

(ආ) අක්ෂර උප්පත්තිස්ථාන දැක්වෙන බාලාවතාර පාඨය ලියා දක්වන්න.

(ඉ) පහත සඳහන් පද විසන්ධි කර සන්ධි වර්ගය ලියන්න.

i. දූරතොව ii. එසධම්මො iii. එතදවොච iv. ඉදමාසනං v. තදවසරි vi.පුනරෙව

(ලකුණු 2 + 4 + 6 = 12 යි)

4. (අ) සම්පදානෙ චතුත්‍ථී යන සූත්‍රයේ අර්ථ ලියා නිදසුනක් සපයන්න.

(ආ) ආඛ්‍යාත විභක්ති අට නම් කරන්න.

(ඉ) පහත දැක්වෙන ක්‍රියා පදයන්හි ආඛ්‍යාත විභක්තිය නම් කරන්න

i. කරොහි ii.භවෙය්‍ය iii. භජෙථ iv. අකා v. උපසංකමි vi. අලභිස්සං

(ලකුණු 2 + 4 + 6 = 12 යි)

5. (අ) පහත දැක්වෙන වචන පාලියෙන් ලියන්න.

i. ඊයේ ii. හාත්පස

(ආ) පහත වාක්‍යය යුගල පූර්වක්‍රියා යොදා තනි වාක්‍යය සේ ලියන්න.

i. අහං විහාරං ගච්ඡාමි. අහං බුද්ධං වන්දාමි.
ii. මිගො සීහං පස්සති. සො වෙගෙන ධාවති.
iii. ථෙරා පිණ්ඩාය චරන්ති. තෙ විහාරං පවිසන්ති.
iv. මාතා පුප්ඵානි ඔචිනාති. සා බුද්ධං වන්දති.

(ඉ) පහත දැක්වෙන මාතෘකාවකට අනුව වාක්‍යය හයක් ලියන්න

i. මම ආචරියො ii. කොළම්බනගරං iii. පාලිභාසා

(ලකුණු 2 + 4 + 6 = 12 යි)

6. (අ) සියො............ස්මිං සු යන සූත්‍රය සම්පූර්ණ කර ලියන්න.

(ආ) වානර හා වනිතා ශබ්දවල **ඡට්ඨී සත්තමී** විභක්ති රූප ලියා දක්වන්න.

(ඉ) සර්වනාම ශබ්ද 12ක් නම් කරන්න.

(ලකුණු 2 + 4 + 6 = 12 යි)

7. (අ) සූත්‍ර හා විනය පිටක හඳුන්වන දේශනා නාමය ලියන්න.

(ආ) උදානපාළියේ වර්ග අට නම් කරන්න.

(ඉ) ගබ්භිනී සූත්‍රයේ සාරාංශය ලියා දක්වන්න.

(ලකුණු 2 + 4 + 6 = 12 යි)

8. (අ) අපදානට්ඨකථාවේ නම හා කතුවරයා නම් කරන්න.

(ආ) එකූපොසථික වර්ගයට අයත් අපදාන හතරක් නම් කරන්න.

(ඉ) ප්‍රජාපතී ගෝතමී තෙරණියට පරිනිර්වානයට සිතුවිලි පහළ වූ අවස්ථාවේ දී සිදු වූ අසිරිමත් සිද්ධි හයක් ලියන්න.

(ලකුණු 2 + 4 + 6 = 12 යි)

***

| | |
|---|---|
| සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved | **මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2019**<br>Primary Piriven Mid Term Test - 2019<br>05 ශ්‍රේණිය / Grade 05 |

**පාලි - I** කාලය : පැය එකයි
**PALI - I** Time : One Hour

- .ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 1 බැගින් 40 කි.
- අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරා ගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. පාලි භාෂාවේ ඝෝෂාක්ෂර ගණනින්,

01. 11 කි. 02. 33 කි. 03. 21 කි. 04. 41 කි.

02. දන්තජ අකුරු පමණක් ඇති වරණය තෝරන්න.

01. ත ද න ල 02. ත ද ප ස
03. ත ඨ ද ජ 04. ත න ම ල

03. පටිවසති යන්නෙහි නිවැරදි උපසර්ග පදය වන්නේ,

01. පටි + වසති 02. පිළි + වසති
03. පති + වසති 04. පරි + වසති

04. යදිදං යන්නෙහි නිවැරදි විසන්ධි පදය ඇති වරණය තෝරන්න,

01. යං + ඉදං 02. යදි + ඉදං
03. යදි + දං 04. යද් + ඉදං

05. එක ශබ්දය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,

01. පුල්ලිංගයේ පමණක් වරනැගේ. 02. ඉත්ථිලිංගයේ පමණක් වරනැගේ.
03. පුල්ලිංගයේ සහ ඉත්ථිලිංගයේ වරනැගේ. 04. ලිංගත්‍රයේම වරනැගේ.

06. **දහහතර** හැඳින්වීමට භාවිත නොවන වචනය වන්නේ,

01. චතුද්දස 02. චුතුද්දස 03. චුද්දස 04. චොද්දස

07. කොරව්‍යස්ස යන්න,

01. සමාස පදයකි. 02. තද්ධිත පදයකි. 03. අව්‍ය පදයකි. 04. කිතක පදයකි.

08. කාරක නොවන විභක්ති දෙක වන්නේ,

01. ඡට්ඨී හා කරණ 02. පඤ්චමී හා ආලපන
03. චතුත්ථී හා ඡට්ඨී 04. ඡට්ඨී හා ආලපන

09. ථෙරා නවහි මාසෙහි සංගීතිං අකංසු. මෙම වාක්‍යයෙහි <u>නවහි මාසෙහි</u> යනු,
01. ක්‍රියාප්‍රවර්ගාර්ථයයි. 02. කාලාර්ථයයි. 03. තාදර්ථයයි. 04. හේත්වර්ථයයි.

10. බ්‍රාහ්මණෙසු දෙවදත්තො පණ්ඩිතො. යන්න උදාහරණයක් වන්නේ,

01. ව්‍යාපික ආධාරයට ය. 02. නිර්ධාරණාර්ථයට ය.
03. භාවාර්ථයට ය. 04. සම්ප්‍රදානාර්ථයට ය.

11. උරබ්භසතානි යනු,

01. උරගයින් සියයකි. 02. ඌරන් සියයකි.
03. සුදු වළාකුළු සියයකි. 04. බැටළුවන් සියයකි.

12. අකර්මක ක්‍රියාපද පමණක් ඇති වරණය වන්නේ,

01. හසති, ලිඛති, ජීරති, පූජෙති 02. ලිඛති, පූජෙති, රුජති, හසති,
03. හසති, කන්‍දති, ජීරති, උදෙති 04. ජින්දති, හසති, කන්‍දති, පීරති

13. ආඛ්‍යාතය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.

01. කාලත්‍රයක් ඇත. 02. පුරුෂත්‍රයක් ඇත.
03. කාරකත්‍රයක් ඇත. 04. ලිංගත්‍රයක් ඇත.

14. 'ය' විකරණය අයත් වන්නේ,

01. දිවාදි ගණයට ය. 02. ස්වාදි ගණයට ය.
03. කියාදි ගණයට ය. 04. රුධාදි ගණයට ය.

15. අංගුත්තර නිකායට ලියැවුණු අටුවාව වන්නේ,

01. සුමංගලවිලාසිනී 02. පපඤ්චසූදනී
03. සාරත්‍ථප්පකාසිනි 04. මනොරථපූරණී

16. සංගාමජි සූත්‍රය,

01. නන්ද වග්ගයේ 3 වන සූත්‍රයයි. 02. මුචලින්ද වග්ගයේ 9 වන සූත්‍රයයි.
03. බෝධි වග්ගයේ 8 වන සූත්‍රයයි. 04. චූලවග්ගයේ 6 වන සූත්‍රයයි.

17. අනුප්පත්තො හොති යනු,

01. පැමිණියේ වෙයි. 02. නොපැමිණියේ වෙයි.
03. නූපන්නේ වෙයි. 04. උඩපැන්නේ වෙයි.

18. මහා ප්‍රජාපති ගෝතමිය ආයු සංස්කාරය අත්හළ විට සිදු නොවූවක් වන්නේ,

01. මහපොළව කම්පා විය. 02. සාගරය ගොඩගැලුවේය.
03. මේඝ ගර්ජනා ඇතිවිය. 04. දේවතාවෝ කඳුළු සැලූහ.

19. "භික්ඛුනී නිලය" යනු,

01. භික්ෂුණීන්ගේ තනතුරු ය. 02. භික්ෂුණීන් නැමති සුළඟය.
03. භික්ෂුණී ආරාමය ය. 04. භික්ෂුණීන්ගේ ආහාරය ය.

20. 'ආසිවිස ආලය සමො' යන්නෙන් අදහස් වන්නේ,

01. සර්පයන්ගේ ආදරය වැනිය යන්නයි.
02. ප්‍රේමයට ආශිර්වාද කළයුතු කාලය යන්නයි.
03. සර්පයන්ට කිරි පෙවීම වැනිය යන්නයි.
04. සර්පයන් වසන තුඹසක් සමාන වූ යන්නයි.

21. උල්ලිඛාපෙති යන්නෙහි අදහස වන්නේ,

01. කොණ්ඩය පීරවයි.
02. කොණ්ඩය කපවයි.
03. හිස මුඩු කරවයි.
04. හිස සරසවයි.

22. සාමි දාසෙන කම්මං කාරෙති යන්නෙහි දාසෙන යන පදය,

01. අනුක්ත කර්තෘ පදයකි.
02. කරණ විභක්ති පදයකි.
03. ප්‍රයෝජ්‍ය කර්තෘ පදයකි.
04. ප්‍රයෝජක කර්තෘ පදයකි.

23. නිවැරදි අකාරාදි පිළිවෙළ ඇති වරණය තෝරන්න.

01. අභිවාදෙත්‍වා, එතදවොච, උපසංකම්ම, අනුජානාම
02. අඤ්ඤතරං, එවරූපෙ, උපනිස්සාය, උට්ඨෙහි
03. අනගාරියං, ආගාරස්මා, ආගමිස්සති, අනුජානිස්සථ
04. ඉධෙව, උදග්ගො, එතදවොච, එහි

24. අපසාලාය ආයන්ති වාණිජා යන වාක්‍යයෙහි අපසාලාය යන පදය යෙදී ඇත්තේ,

01. පඤ්චමී විභක්තියෙනි.
02. සත්තමී විභක්තියෙනි.
03. තතියා විභක්තියෙනි.
04. චතුත්ථී විභක්තියෙනි.

25. පබ්බජිතම්පි යන්නෙහි නිවැරදි විසන්ධිය වන්නේ,

01. පබ්බජිත + ම්පි
02. පබ්බජිතං + අපි
03. පබ්බ + ජිතම්පි
04. පබ්බජිතං + පි

26. තද්ධිත පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

01. සොරතා, නිවාතා, දක්ඛා, උපසන්තතා
02. නිවාතා, දක්ඛා, උපසන්තා, අනලසා
03. දක්ඛා, අනලසා, උපසන්තා, කල්‍යාණො
04. අනලසා, උපසන්තා, කල්‍යාණො, දිවාතරං

27. 'පළිබොධො' යන්නෙහි යෙදී ඇති උපසර්ග පදය වන්නේ,

01. පළි
02. පරි
03. පිළි
04. පති

28. බුද්ධඝෝෂ හිමි එනමින් ප්‍රකට වූයේ,

01. ත්‍රිපිටකයට අටුවා ලියූ නිසාය.
02. පැවිදි වීමේදී ගුරු හිමියන් එම නම තැබූ නිසාය.
03. බුදුරදුන්ගේ හඬට සමාන හඬක් තිබූ නිසාය.
04. වාද කිරීමෙහි දක්ෂයෙකු වූ නිසාය.

29. අභික්කමති යන්නෙහි නිවැරදි පද බෙදීම වන්නේ,

01. අභි + කමති
02. අභික්ක + මති
03. අභි + කමු + ති
04. අභි + ඛම + ති

30. හාත්පස යන තේරුම නොයෙදෙන වචනය ඇතුළත් වරණය තෝරන්න.

01. සන්තිකෙ    02. සමන්තා    03. පරිතො    04. අභිතො

31. ක්‍රියා විශේෂණ පමණක් ඇතුළත් වරණය වන්නේ,

01. සුඛං, නූන, යථාපි, ඉංඝ
02. ඊසකං, මුහුත්තං, අභිණ්හං, තතො
03. සීඝෙන, සුඛෙන, අභිභූය, අලිකං
04. සක්කච්චං, නිබද්ධං, සාධුකං, සුඛං

32. සමාස පද ලිංග ලබන අයුරු සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය ඇතුළත් වරණය තෝරන්න.

01. සමාගාර දිගු සමාසය නපුංසකලිංග ඒකවචන වේ.
02. කම්මධාරය සමාසය පූර්ව පදයේ ලිංගය භජනය කරයි.
03. තප්පුරිස සමාසය පරපදයේ ලිංගය භජනය කරයි.
04. බහුබ්බීහි සමාසය අන්‍යපදයේ ලිංගය ගනී.

33. චතුරාරක්ඛා යන පදයේ නිවැරදි විසන්ධිය වන්නේ,

01. චතුරා + ආරක්ඛා    02. චතුරා + රක්ඛා
03. චතු + ආරක්ඛා    04. චතුර් + ආරක්ඛා

34. "න භජෙ පාපකෙ මිත්තෙ" යන්නෙහි 'භජේ' යනු,

01. සත්තමී පරස්ස පද පඨමපුරිස ඒකවචන අඛ්‍යාත පදයකි.
02. අජ්ජතනී පරස්ස පද පඨමපුරිස ඒකවචන අඛ්‍යාත පදයකි.
03. පඤ්චමී අත්තනො පද උත්තම පුරුෂ ඒකවචන පදයකි.
04. අජ්ජතනී අත්තනො පද මධ්‍යම පුරුෂ ඒකවචන පදයකි.

35. "ණා" විකරණය යෙදෙන ධාතුගණ දෙක වන්නේ,

01. චුරාදි ගණය හා තනාදි ගණයයි.
02. රුදාදි ගණය හා දිවාදි ගණයයි.
03. ස්වාදි ගණය හා කියාදි ගණයයි.
04. භුවාදි ගණය හා ගහාදි ගණයයි.

36. ක්‍රියා විශේෂණය යොදනු ලබන්නේ,

01. පඨමා හා තතියා විභක්තිවලිනි.
02. චතුත්ථී හා ඡට්ඨී විභක්තිවලිනි.
03. පඤ්චමී හා සත්තමී විභක්තිවලිනි.
04. දුතියා හා තතියා විභක්තිවලිනි.

37. අථ ඛො භික්ඛවෙ කාලියා දාසියා එතදහොසි යන වාක්‍යයේ <u>කාලියා දාසියා</u> යන්න යෙදී ඇත්තේ,

01. තතියා ඒකවචනයෙනි.    02. දුතියා ඒකවචනයෙනි.
03. චතුත්ථී ඒකවචනයෙනි.    04. ඡට්ඨී ඒකවචනයෙනි.

38. ඝාරිකා යනු,

01. පණුවන් ය.    02. බිබිලිය.    03. පැටවුන් ය.    04. අලු ය.

39. බීජං + ඉව යන විසන්ධිය බීජංව යනුවෙන් සන්ධි කිරීමට අවශ්‍ය බාලාවතාර සූත්‍රය වන්නේ,

01. නිග්ගහීතං ච   02. ව්‍යඤ්ජනෙ වෙ   03. පරො වා සරො   04. සයෙ ච

40. අධිවචනං යන්නට සුදුසු තේරුම වන්නේ,

01. බුද්ධ වචනයයි.   02. විශේෂ වචනයයි.
03. අපරනාමයකි යන්නයි.   04. අධික වචනයකි යන්නයි.

***

| | |
|---|---|
| සියලු ම හිමිකම් ඇවිරිණි All Rights Reserved) | **මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2019** |
| | Primary Piriven Mid Term Test - 2019 |
| | 05 ශ්‍රේණිය / Grade 05 |
| | **පාලි - II** කාලය : පැය තුනයි |
| | **PALI - II** Time : Three Hour |

❖ **I** කොටසේ සියලු ම ප්‍රශ්නවලට ද **II** කොටසින් තවත් ප්‍රශ්න තුනකට ද පිළිතුරු සපයන්න.

I කොටස

1. (අ) සිංහලට නගන්න.

අථඛො ආයස්මතො සඞ්ගාමජිස්ස පුරාණදුතියකා අවිදූරං ගනත්වා අපලොකෙන්තී, අද්දස ආයස්මන්තං සඞ්ගාමජිං තං දාරකං නෙව ඕලොකෙන්තං න පි ආලපන්තං. දිස්වානස්සා එතදහොසි, න චායං සමණො පුත්තෙනපි අත්‍ථිකො'ති. තතො පටිනිවත්තිත්වා දාරකං ආදාය පක්කාමි. අද්දසා ඛො භගවා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන ආයස්මතො සඞ්ගාමජිස්ස පුරාණ දුතියිකාය. එවරූපං විප්පකාරං.

(ලකුණු 06)

(ආ) අසජ්ජමානා අගමා - භූමියම්පි නිමුජ්ජථ
අභිජ්ජමානෙ උදකෙ - අගඤ්ඡි මහියා යථා.

සකුණීව යථාකාසෙ - පල්ලඞ්කෙන ගමි තදා
වසං වත්තෙසි කායෙන - යාව බ්‍රහ්මනිවෙසනං.

සිනෙරු දණ්ඩං කත්වාන - ඡත්තං කත්වා මහාමහිං
සමූලං පරිවත්තෙත්වා - ධාරෙන්ති චඞ්කමී නභෙ.

(ලකුණු 06)

2. (අ) පාලියට නගන්න.

i. සංඝයාට දෙන ලද දේ නො නැසෙන්නේ ය.
ii. බ්‍රහ්ම ලෝකය දක්වා ශබ්දය උස්ව නැගේ.
iii. සැමදා ඔබට යහපතක් ම වේවා!

(ලකුණු 06)

(ආ) ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

භූතපුබ්බං භික්ඛවෙ ඉමස්සායෙව සාවත්ථියා වෙදෙහිකා නාම ගහපතානි අහොසි. වෙදෙහිකාය භික්ඛවෙ ගහපතානියා එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො සොරතා වෙදෙහිකා ගහපතානි, නිවාතා වෙදෙහිකා ගහපතානි, උපසන්තා වෙදෙහිකා ගහපතානීති. වෙදෙහිකාය ඛො පන භික්ඛවෙ ගහපතානියා කාළි නාම දාසි අහොසි, දක්ඛා, අනලසා, සුසංවිහිතකම්මන්තා. අථ ඛො භික්ඛවෙ කාලියා දාසියා එතදහොසි. මය්හං ඛො අය්‍යාය එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො, සොරතා වෙදෙහිකා ගහපතානි නිවාතා වෙදෙහිකා ගහපතානි, උපසන්තා වෙදෙහිකා ගහපතානීති කින්නු ඛො මෙ අය්‍යා සන්තංයෙව නු ඛො අජ්ඣත්තං කොපං න පාතු කරොති? උදාහු අසන්තං උදාහු මය්හමෙවෙතෙ කම්මන්තා සුසංවිහිතා. යෙන මෙ අය්‍යා සන්තංයෙව අජ්ඣත්තං කොපං න පාතුකරොති, නො අසන්තං, යන්නූනාහං අය්‍යං වීමංසෙය්‍යන්ති, අථ ඛො භික්ඛවෙ කාළිදාසි දිවා උට්ඨාසි. අථ ඛො භික්ඛවෙ වෙදහිකා ගහපතානි කාළිං දාසිං එතදවොච. හෙ ජෙ කාළීති කිං අයෙ‍්‍යාති. කිං ජෙ දිවා උට්ඨාසීති, න ඛො අයෙ‍්‍යා කිඤ්චීති. නො වත රෙ කිඤ්චි පාපී දාසි දිවා උට්ඨාසීති. කුපිතා අනත්තමනා භකුටිං අකාසි.

01 මෙහි දැක්වෙන දාසියගේ නම හා ඇය සතුව පැවති ගුණාංග මොනවාද?
02 වේදහිකා ගෘහපතිනිය සම්බන්ධව පැන නැගුණු කීර්ති රාවය කුමක්ද?
03 දාසිය තුළ ඇති වූ සිතිවිල්ල ලියා දක්වන්න.
04 දවල් වී අවදි වූ දාසියට ගෘහපතිනිය කී දේ ලියන්න. (ලකුණු 1 + 1 + 2 +2 =06)

II කොටස

3. (අ).හ්‍රස්ව ස්වර හැඳින්වෙන බාලාවතාර සූත්‍ර පාඨය ලියන්න.

(ආ).පහත දැක්වෙන අකුරුවල උත්පත්තිස්ථානය ලියන්න.

i. උ ...............................
ii. ණ ...............................
iii. ඔ ...............................
iv. ඣ ...............................
v. ස ...............................
vi. හ ...............................
vii. ළ ...............................
viii ය ...............................

(ඉ).පහත විසන්ධි පද කිහිපයක් සන්ධි කොට දක්වා තිබේ. එම විසන්ධි පද සන්ධි කිරීම සඳහා යොදා ගන්නා සූත්‍ර ඒ ඉදිරියෙන් ලියන්න.

i. සො + අස්ස = ස්වස්ස = ...............................
ii. කිංසු + ඉධ = කිංසූධ = ...............................
iii. සෙත + ඡත්තං = සෙතච්ඡත්තං = ...............................
iv. අව + නද්ධා = ඔනද්ධා = ...............................
v. එතං + අවොච = එතදවොච = ...............................
vi. බීජං + ඉව = බීජංව = ...............................

(ලකුණු 2 + 4 + 6 =12)

4. (අ).ස්‍යාද්‍යන්ත, ත්‍යාද්‍යන්ත නම්වලින් හැඳින්වෙන්නේ මොනවාද?

(ආ).පහත දැක්වෙන පදවලට ගැලපෙන එත ශබ්දයේ සර්වනාම පද ලියන්න.

i. මනුස්සො ...............................
ii. වනිතා ...............................
iii. පුප්ඵං ...............................
iv. නරෙන ...............................
v. ගාමම්හා ...............................
vi. වානරස්ස ...............................
vii. ගාමෙ ...............................
viii. දයකෙහි ...............................

(ඉ).පහත දැක්වෙන නාම පදවල විභක්තිය හා සිංහලාර්ථ ලියන්න.

| නාම පදය | විභක්තිය | සිංහලාර්ථය |
|---|---|---|
| වානරෙන | ............................... | ............................... |
| වනිතානං | ............................... | ............................... |
| කවිනා | ............................... | ............................... |
| අග්ගිම්හා | ............................... | ............................... |
| එකූනසතෙ | ............................... | ............................... |
| තිස්සො | ............................... | ............................... |

(ලකුණු 2 + 4 + 6 =12)

5. (අ). චුරාදි ගණයේ යෙදෙන විකරණ ප්‍රත්‍ය දෙක ලියන්න.

(ආ). සත්තමී, හීයත්තනී ආඛ්‍යාත විභක්ති හැඳින්වෙන බාලාවතාර සූත්‍ර ලියා අර්ථය දක්වන්න.

(ඉ). පහත දැක්වෙන ආඛ්‍යාත පදවල ආඛ්‍යාත විභක්තිය හා පුරුෂය ලියන්න.

| ආඛ්‍යාත පදය | අඛ්‍යාත විභක්තිය | පුරුෂය |
|---|---|---|
| ලභතු | ................................ | ................................ |
| ජානෙය්‍යා | ................................ | ................................ |
| ආචික්ඛිස්සාමි | ................................ | ................................ |
| අගා | ................................ | ................................ |
| ජගාම | ................................ | ................................ |
| ආසිං | ................................ | ................................ |

(ලකුණු 2 + 4 + 6 =12)

6. (අ) "ඒකාන්තයෙන්" යන තේරුම දෙන නිපාත පද 04ක් ලියන්න.

(ආ) පහත දැක්වෙන ක්‍රියා පදයන්හි අර්ථ ලියන්න.

1. නික්ඛමති ................................
2. සංකමති ................................
3. ඔක්කමති ................................
4. අක්කමති ................................

(ඉ) පහත දැක්වෙන මාතෘකාවකට අනුව වාක්‍ය 5කට නොඅඩු රචනාවක් ලියන්න.

1. ගාමං 3. වනං
2. නගරං 4. ජලං

(ලකුණු 2 + 4 + 6 =12)

7. (අ) සමාස ප්‍රයෝජන දෙකක් ලියන්න.

(ආ) පහත දැක්වෙන සමාස පදවල සමාස ප්‍රභේදය ලියන්න.

1. චතුද්දිසා
2. නාගමානවිකා
3. දෙවරාජා
4. ජාතරූපං

(ඉ) පහත සඳහන් හිස්තැන් සම්පූර්ණ කරන්න.

1. ................................ පරපදෙහි
2. නාමානං සමුච්චයො ................................
3. ................................ බහුබ්බීහි
4. ................................ අබ්‍යයීභාවො
5. ................................ දිගු
6. ................................ කම්මධාරයො

(ලකුණු 2 + 4 + 6 =12)

8. (අ) ආණාදෙසනා, වොහාරදෙසනා යනුවෙන් හඳුන්වන්නේ ත්‍රිපිටකයේ කවර කොටසක් ද?

(ආ)ආයන්තිං නාභිනන්‍දති. යන ගාථාව සම්පූර්ණ කරන්න.

(ඉ) නන්ද තෙරුන් වහන්සේගේ කථා පුවත සැකෙවින් ලියා දක්වන්න. (ලකුණු 2 + 4 + 6 =12)

***

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமை உடையது]
All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**මධ්‍යවාර පරීක්ෂණය - 2022**
**இரண்டாம் தவணைப் பரீட்சை - 2022**
**Mid Year Term Test - 2022**

පැය එකයි

**පාලි i** විභාග අංකය : ........................................... **5 ශ්‍රේණිය**

---

සැලකිය යුතුයි.

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 01 බැගින් 40 කි.
- අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවල 1, 2, 3, 4 උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන උත්තරය තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ × ලකුණ යොදන්න.

---

01. පාලි අක්ෂර මාලාවේ ඝෝෂාක්ෂර සංඛ්‍යාව,
    (1) 11 කි. (2) 20 කි. (3) 21 කි. (4) 10 කි.

02. අකාරාදි පිළිවෙල අනුව පද ගළපා ඇති වරණය තෝරන්න.
    (1) අජසත්තානි, ධාරෙය්‍ය, පකාසිතො, සෙය්‍යථීදං
    (2) අජසත්තානි, ධාරෙය්‍ය, සෙය්‍යථීදං, පකාසිතො
    (3) ධාරෙය්‍ය, අජසත්තානි, පකාසිතො, සෙය්‍යථීදං
    (4) අජසත්තානි, පකාසිතො, ධාරෙය්‍ය, සෙය්‍යථීදං

03. **ඔට්ඨජාක්ෂර** පමණක් ඇතුළත් වරණය තෝරන්න.
    (1) ත, ර, ළ, ම (2) උ, ඌ, ල, ප (3) ප බ, ම, උ (4) ය, ස, ල, ව

04. **77** හා **87** යන සංඛ්‍යා නිවැරදිව පාලියෙන් ප්‍රකාශ කෙරෙන සංඛ්‍යා නාම ඇතුළත් වරණය තෝරන්න.
    (1) සත්තාසීති, සත්තපඤ්ඤාසති (2) සත්තතිංසති, සත්තාසීති
    (3) සත්තසත්තති සත්තසට්ඨි (4) සත්තසත්තති, සත්තාසීති

05. **'සම්ප්‍රදානෙ චතුත්ථී'** යන බාලාවතර සූත්‍රයට නිදසුන් කළ හැකි පාලි වාක්‍ය තෝරන්න.
    (1) කඤ්ඤා යාචකස්ස භත්තං දෙති. (2) බුද්ධෙන ධම්මො දෙසිතො.
    (3) මනුස්සා චොරම්හා භායන්ති. (4) රාජා ආසනෙ නිසීදති.

06. **'ලොකග්ගො'** යනු,
    (1) නිපාත පදය කි. (2) සන්ධි පදය කි.
    (3) උපසර්ග පදය කි. (4) කිතක පදය කි.

07. පාලි භාෂාවේ **'උපසර්ග'** ගණන,
    (1) 20 කි. (2) 10 කි. (3) 21 කි. (4) 23 කි.

08. **'ද්වන්ද සමාසය'** සඳහා පමණක් නිදසුන් ඇති වරණය වන්නේ,

(1) චක්ඛුසොතං , පත්තචීවරං , යුගනංගලං , මාතාපිතරො

(2) මහා විහාරො , මාතාපිතරො , ගුණධනං , අසුරො

(3) අනිච්චසඞ්ඛාරා , කුදිට්ඨි , ජිනචරිතං , පත්තචීවරං

(4) සාරිපුත්තත්ථෙරො , විකාලභොජනං , සුගන්ධො , අසුරො

09. පාලි භාෂාවේ **'සමාස'** ගණන,

(1) 4 කි. (2) 8 කි. (3) 6 කි. (4) 5 කි.

10. **'අව්‍ය පද'** සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වනුයේ,

(1) නාමපද දෙකක් එකතු වී සෑදෙන පද යි. (2) වර නොනැගෙන පද යි.

(3) වර නැගෙන පද යි. (4) නාමයකට ප්‍රත්‍ය එකතු වී සෑදෙන පද යි.

11. **'පඤ්චමී'** ආඛ්‍යාත පදයක් සහිත වාක්‍ය තෝරන්න.

(1) දෙවො වස්සතු කාලෙන. (2) අහං උපාලිං විනයං පුච්ඡෙය්‍යං.

(3) සො ගාමං ගච්ඡති. (4) ත්වං හීයො ගාමං ගච්ඡො.

12. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලද්දේ බුද්ධ පරිනිර්වාණයෙන්,

(1) වසර 440කට පසු ය. (2) වසර 240කට පසු ය.

(3) වසර 244කට පසු ය. (4) වසර 340කට පසු ය.

13. **'ඛුද්ධක නිකායට'** අයත් ග්‍රන්ථයන් ගණන ඇතුළත් වරණය තෝරන්න.

(1) 16 කි. (2) 14 කි. (3) 15 කි. (4) 20 කි.

14. **'සුක්කවාරො'** යනු,

(1) බදාදා ය. (2) බ්‍රහස්පතින්දා ය. (3) සිකුරාදා ය. (4) ඉරිදා ය.

15. **උදානපාළියේ** ඇතුළත් වර්ග සංඛ්‍යාව,

(1) වර්ග 7 කි. (2) වර්ග 8 කි. (3) වර්ග 9 කි. (4) වර්ග 6 කි.

16. **උදානපාළිය** ඛුද්දක නිකායේ,

(1) 6 වැනි ග්‍රන්ථය යි. (2) 7 වැනි ග්‍රන්ථය යි.

(3) 4 වැනි ග්‍රන්ථය යි. (4) 3 වැනි ග්‍රන්ථය යි.

17. බුදුගොස් හිමියන් ලක්දිවට වැඩම කරවන ලද්දේ,

(1) මහසෙන් රජු දවස ය. (2) මහානාම රජු දවස ය.

(3) වළගම්බා රජු දවස ය. (4) දේවානම්පියතිස්ස රජු දවස ය.

18. **'මදාසරෙ'** යන සූත්‍රයෙන් සන්ධි වී ඇති පදය තෝරන්න.

(1) දෙවාති (2) කිඤ්චිදෙව (3) ගච්ඡාමි (4) බුද්ධානමෙව

19. උපසර්ගයන්ගේ කාර්යයක් නොවන්නේ,

(1) ධාතුවේ අර්ථයට බාධා කිරීම. (2) ධාතුවේ අර්ථයට අනුකූලවීම.
(3) ධාතුවේ අර්ථය විසිතුරු කිරීම. (4) ධාතුවේ අර්ථය නැතිකිරීම.

20. පාලි භාෂාවේ ප්‍රධාන සන්ධි ප්‍රභේද,

(1) 6 කි. (2) 5 කි. (3) 4 කි. (4) 8 කි.

21. ''අහං උපාලිං විනයං **පුච්ඡෙය්‍යාං**'' මෙම පාඨයේ ඉරි ඇඳි පදයේ ආඛ්‍යාත විභක්තිය වන්නේ,

(1) වත්තමානා ආඛ්‍යාතය යි. (2) සත්තමී ආඛ්‍යාතය යි.
(3) පරොක්ඛා ආඛ්‍යාතය යි. (4) පඤ්චමී ආඛ්‍යාතය යි.

22. **'භික්ඛුනොවාදො'** යන පදය සන්ධි වී ඇත්තේ,

(1) 'වා පරො අසරූපා' සූත්‍රයෙනි. (2) 'යමෙදන්තස්සාදෙසො' සූත්‍රයෙනි.
(3) 'සරා සරෙ ලොපං' සූත්‍රයෙනි. (4) 'නිග්ගහීතං ච' සූත්‍රයෙනි.

23. ඒකාන්තයෙන් යන තේරුම රහිත නිපාත පදයකි.

(1) හවෙ (2) වත (3) නූන (4) ආසු

24. උපසර්ග පදයක් රහිත පදය වන්නේ,

(1) නිවාරයති (2) වන්දති (3) ආගච්ඡති (4) පක්කමති

25. **"උජුජාතිකො"** යන්නෙහි අර්ථය වන්නේ,

(1) ඍජු ජාතික යන්න යි. (2) වංක ජාතික යන්න යි.
(3) සුදු ජාතික යන්න යි. (4) කපටි ජාතික යන්න යි.

26. **'උදාන'** සම්බන්ධයෙන් නිවැරදිම ප්‍රකාශය වන්නේ,

(1) පච්චෙක බුද්ධභාසිත ය. (2) බුද්ධභාසිත ය.
(3) සාවක භාසිත ය. (4) ඉහත සියල්ලම ය.

27. **'සහ, සද්ධිං, සමං'** යන නිපාත පද,

(1) දුතියා විභක්තිය සමග යෙදේ. (2) චතුත්ථී විභක්තිය සමග යෙදේ.
(3) ආලපන විභක්තිය සමග යෙදේ. (4) තතියා විභක්තිය සමග යෙදේ.

28. උපමාවක් ලෙස භාවිත යෙදුම වන්නේ,

(1) අග්ගික්ඛන්ධා විය ජලමානා විචරන්ති. (2) සීහො පන චතුප්පාදො සත්තො.
(3) සීහා පන මංසඛාදකා සත්තා භවන්ති. (4) අපසාලාය ආයන්ති වාණිජා.

29. මහාප්‍රජාපති ගෝතමිය සමග පිරිනිවන් පෑ භික්ෂුණී වහන්සේලා ගණන වන්නේ,

(1) 5000 කි (2) 500 කි (3) 100 කි (4) 1000 කි

30. මහාප්‍රජාපති ගෝතමී තෙරණිය පිරිණිවන්පාන බව බුදුරදුන්ට දැන්වූයේ,

(1) සැවැත්නුවර දී ය. (2) රජගහනුවර දී ය.
(3) විශාලා මහනුවර දී ය. (4) කපිලවස්තුපුරයේ දී ය.

31. මහා ප්‍රජාපතීථේරි අපදානයේ ගාථා සංඛ්‍යාව,

(1) 90 කි. (2) 190 කි. (3) 290 කි. (4) 180 කි.

32. **'අබ්භුග්ගතො'** යන්නෙහි නිවැරදි විසන්ධිය වන්නෙ,

(1) අභි + උග්ගතො (2) අභි + ගගතො

(3) අභු + උග්ගතො (4) අභි + අග්ගතො

33. කිතක පදයක් යනු,

(1) නාම පදයකට ප්‍රත්‍ය එක්වී සෑදෙන පදය කි. (2) වර නොනැගෙන පදය කි.

(3) ධාතුවකට ප්‍රත්‍ය එකතු වී සෑදෙන පදය කි. (4) නාම පද දෙකක් එකතු වී සෑදෙන පදය කි.

34. පාලි භාෂාවේ ආඛ්‍යාත විභක්ති ගණන,

(1) 8 කි. (2) 7 කි. (3) 5 කි. (4) 9 කි.

35. සමාන පද යුගලයක් නොවන්නේ,

(1) ඡනවුති - ජනනවුති (2) සතසහස්සං - ලක්ඛං

(3) අට්ඨාදස - අට්ඨාරස (4) වීසති - තිංසති

36. 'භගවා <u>**තායං වෙලායං**</u> ඉමං උදානං උදානෙසි' අංකිත පදයේ විභක්ති ප්‍රයෝගය වන්නේ,

(1) භාවාර්ථයේ දුතියා. (2) කාලාර්ථයේ දුතියා.

(3) කාලාර්ථයේ සත්තමි. (4) අත්‍යන්ත සංයෝගයේ දුතියා.

37. **'විනා, නානා , අඤ්ඤත්‍ර , අලං'** යන නිපාත අයත් කාරක විභක්තිය වන්නේ,

(1) දුතියා විභක්තිය යි. (2) කරණ විභක්තිය යි.

(3) තතියා විභක්තිය යි. (4) චතුථී විභක්තිය යි.

38. **"මහාපුරිසො"** යන සමාස පදයේ නිවැරදි විග්‍රහ වාක්‍යය වන්නේ,

(1) මහන්තං පුරිසං (2) මහන්තො සො පුරිසො

(3) මහන්තෙන පුරිසෙන (4) මහන්තං තං පුරිසො

39. පූර්ව ස්වරය ලොප් කරන සූත්‍රය වන්නේ,

(1) සරා සරෙ ලොපං (2) වා පරො අසරූපා

(3) පුබ්බොච (4) පරද්වෙභාවොඨානෙ

40. **'අගමිස්සංසු'**යන පදය අයත් වන ආඛ්‍යාත පදය වන්නේ,

(1) හීයත්තනී (2) අජ්ජතනි

(3) සත්තමි (4) කාලාතිපත්ති

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமை உடையது]
All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**මධ්‍යවාර පරීක්ෂණය - 2022**
**இரண்டாம் தவணைப் பரீட்சை - 2022**
**Mid Year Term Test - 2022**

පැය තුනයි

**පාලි ii** විභාග අංකය : ........................................... **5 ශ්‍රේණිය**

❖ **i කොටසේ ප්‍රශ්න සියල්ලට ද, ii කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

## i කොටස

01. (අ) සිංහලයට නගන්න.

''රඤ්ඤො බො පන පසෙනදිස්ස කොසලස්ස කොට්ඨාගාරෙ සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා සප්පිස්ස වා තෙලස්ස වා යාවදත්ථං පාතුං දීයති, නො නීහරිතුං. යන්නූනා'හං රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස කොට්ඨාගාරං ගන්ත්වා තෙලස්ස යාවදත්ථං පිවිත්වා ඝරං ආගන්ත්වා උග්ගිරිත්වාන දදෙය්‍යං, යං ඉමිස්සා විජාතාය භවිස්සතී''ති. අථ ඛො සො පරිබ්බාජකො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස කොට්ඨාගාරං ගන්ත්වා තෙලස්ස යාවදත්ථං පිවිත්වා ඝරං ආගන්ත්වා නෙව සක්කොති උද්ධං කාතුං, න පන අධො. සො දුක්ඛාහි තිබ්බාහි ඛරාහි කටුකාහි වෙදනාහි ඵුට්ඨො ආවට්ටති, පරිවට්ටති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථියං පිණ්ඩාය පාවිසි. අද්දසා ඛො භගවා තං පරිබ්බාජකං දුක්ඛාහි තිබ්බාහි ඛරාහි කටුකාහි වෙදනාහි ඵුට්ඨං ආවට්ටමානං පරිවට්ටමානං.

(ලකුණු 06 යි)

(ආ) සිංහලයට නගන්න

තා එවමනුසාසිත්වා භික්ඛුනීහි පුරක්ඛතා,
උපෙච්ච බුද්ධං වන්දිත්වා ඉදං වචනමබ්‍රවි.

''අහං සුගත මාතා තෙ ත්වං ච වීර පිතා මම,
සද්ධම්මසුඛදො නාථ තයා ජාතම්හි ගොතම.

සංවද්ධිතො'යං සුගත රූපකායො මයා තව,
අනින්දියො ධම්මකායො මම සංවද්ධිතො තයා. ( ලකුණු 06 යි )

02. (අ) පාලියට නගන්න.

i. ශ්‍රද්ධාවන්ත භික්ෂුව උදෑසනම සක්මන් කරයි.
ii. පවිටු මිතුරන් ඇසුරු නොකරන්න.
iii. භාග්‍යවතුන් වහන්සේ වෘක්ෂ මූලයට එළඹ දිවා විහරණය කළ සේක. ( ලකුණු 06 යි )

(ආ) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අථ අපරභාගෙ එකො අස්සවාණිජකො අස්සවණිජ්ජාය පුබ්බන්තාපරන්තං ගච්ඡන්තො ආගම්ම ඉමිස්සා ගෙහෙ නිවාසං ගණ්හි. අථ සො වාණිජො තං දිස්වා ධීතුසිනෙහං පතිට්ඨාපෙත්වා ගන්ධමාලවත්ථාලංකාරාදීහි තස්සා උපකාරකො හුත්වා ගමනකාලෙ අම්ම, එතෙසු අස්සෙසු තව රුච්චනකං අස්සං ගණ්හාහීති ආහ. සා'පි අස්සෙ විලොකෙත්වා එකං සින්ධවපොතකං දිස්වා එතං මෙ දෙහීති ආහ. වාණිජො අම්ම, එසො සින්ධවපොතකො අප්පමත්තා හුත්වා පටිජග්ගාහී'ති වත්වා තං පටිපාදෙත්වා අගමාසි. සා'පි තං පටිජග්ගමානා ආකාසගාමීභාවං ඤත්වා සම්මා පටිජග්ගන්තී එවං විනෙන්තී.

i. නිවැසි කාන්තාවට වෙළෙන්දාගෙන් ලැබුණු දේ මොනවා ද?

ii. පසු කලෙක කාන්තාවගේ නිවසේ නතර වූයේ කවුද ?

iii. ධිතුසිනෙහං, පතිට්ඨාපෙත්වා යන වචන දෙකෙහි අර්ථය ලියන්න.

iv. ඉහත ඡේදයේ ඇති "පූර්වක්‍රියා" පද 04 ක් තෝරා ලියන්න.

(ලකුණු 1 + 1 + 2 + 2 = 06 යි )

## ii කොටස

03. (අ) බාලාවතාරයේ ව්‍යඤ්ජනාක්ෂර හඳුන්වන සූත්‍ර පාඨය ලියන්න.

(ආ) **'උපවග්ගා ඔට්ඨජා'** පාඨය හඳුන්වන්න.

(ඉ) පහත සඳහන් සන්ධි පදවල සන්ධි ප්‍රභේදය නම් කරන්න.

i. ඡායාව ii. ඉදමවොච iii. සබ්බෙව

iv. සභික්ඛු vi. මාතුපට්ඨානං v. එසධම්මො

( ලකුණු 2 + 4 + 6 = 12 යි )

04. (අ) **'කම්මත්ථෙ දුතියා'** යන සූත්‍රයේ අර්ථය ලියා ඊට නිදසුනක් ද සපයන්න.

(ආ) පහත සඳහන් පදවල විභක්තිය නම් කරන්න.

i. භික්ඛුමහා ii. අග්ගිං iii. පුප්ඵේසු iv. කඤ්ඤායං

(ඉ) පහත සඳහන් පදයන්හි සමාසය නම් කරන්න.

i. ධංසමකස ii. රාජපුත්තො iii. පංචසීලං

iv. දුභික්ඛං v. සාරිපුත්ත ථෙරො vi. දිට්ඨධම්මො

( ලකුණු 2 + 4 + 6 = 12 යි )

05. (අ) සමාස වලින් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

(ආ) පහත සඳහන් තද්ධිත පදවල අර්ථය ලියන්න.

i. සාකටිකො ii. සතිමන්තො iii. කච්චානො iv. මෙධාවී

(ඉ) පහත සඳහන් මාතෘකාවලින් එකකට අදාළව වාක්‍ය හයක් ලියන්න.

i. බුද්ධො ii. මම පරිවෙණං iii. මහින්දාගමනං iv. මම උපජ්ඣායො

( ලකුණු 2 + 4 + 6 = 12 යි )

06. (අ) පහත සදහන් පද පාලියෙන් ලියන්න.

i. ස්වල්පයක් ii. අද

(ආ) පහත වාක්‍ය යුගල පූර්වක්‍රියා යොදා තනි වාක්‍ය ලෙසින් ලියන්න.

i. මයං පණ්ණසාලං ගච්ඡාම / මයං තත්‍ථ බුද්ධං වන්‍දාම.

ii. භික්ඛු පාතොව පබුජ්ඣති / සො චංකමති.

iii. රාජා ධම්මං සුණාති / සො ධම්මෙන ජීවති.

iv. කුමාරො ධම්මං සොතුං ඉච්ඡති / සො පබ්බජි.

(ඉ) උපසර්ග පද සහිත ක්‍රියාපද හයක් ලියන්න.

( ලකුණු 2 + 4 + 6 = 12 යි )

07. (අ) බුද්ධඝෝෂ හිමියන් විසින් ලියූ අටුවා ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

(ආ) පහත සඳහන් අටුවා ග්‍රන්ථ ලියූ තෙරුන් වහන්සේලා නම් කරන්න.

i. පරමත්‍ථදීපනි

ii. සුමංගල විලාසනි

iii. සද්ධම්මජොතිකා

iv. අත්‍ථසාලිනි

(ඉ) පහත සඳහන් නිපාත පද සුදුසු පරිදි යොදා වාක්‍ය නැවත ලියන්න.

**(සද්ධිං/ සාධුකං/ අභිණ්හං/ මා/ තථා/ නිච්චං/ සතතං/ ඛිප්පං/ පුනප්පුනං)**

i. පබ්බජිතෙන ........................................... පච්චවෙක්ඛිතබ්බං.

ii. ධීතා මාතුයා .......................................... විහාරං ගච්ඡති.

iii. කස්සකා .................................................. බීජානි වපන්ති.

iv. පණ්ඩිතො ............................................ ධම්මං විජානාති.

v ......................................... මනසි කරොථ.

vi සිස්සා පාතොව පබුජ්ඣිත්වා................................. පාඨසාලං ගච්ඡති.

( ලකුණු 2 + 4 + 6 = 12 යි )

08. (අ) අපදාන යන්නෙහි අර්ථය ලියන්න.

(ආ) නවාංග සත්‍ථු සාසනයෙන් අංග හතරක් නම් කරන්න.

(ඉ) නන්‍ද සූත්‍රයේ අන්තර්ගතය කෙටියෙන් ලියන්න.

( ලකුණු 2 + 4 + 6 = 12 යි )

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமை உடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**මධ්‍යවාර පරීක්ෂණය - 2023**
**இரண்டாம் தவணைப் பரீட்சை - 2023**
**Mid Year Term Test - 2023**

පැය එකයි

**පාලි i** විභාග අංකය : ........................................... **5 ශ්‍රේණිය**

සැලකිය යුතුයි.

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 01 බැගින් 40 කි.
- අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවල 1, 2, 3, 4 උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන උත්තරය තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ × ලකුණ යොදන්න.

01. පාලි භාෂාවේ අඝෝෂාක්ෂර ගණනින්,

1) 11 කි. 2) 21 කි. 3) 33 කි. 4) 41 කි.

02. **ඔට්ඨජ අක්ෂර පමණක්** ඇති වරණය තෝරන්න.

1) උ, ප, බ, ම. 2) උ, ප, හ, ල. 3) උ, ප, බ, ඊ. 4) උ, ප, ත, ම.

03. **පච්චෙකං** යන්නෙහි නිවැරදි <u>**උපසර්ගය**</u> වන්නේ,

1) පච්ච + අන්තං 2) පච් + අන්තං 3) පච + අන්තං 4) පති + එකං

04. **ඔනද්ධා** යන්නෙහි නිවැරදි **විසන්ධි පදය** ඇති වරණය තෝරන්න.

1) ඔ + නද්ධා 2) ඔ + අද්ධා 3) අව + අද්ධා 4) අව + නද්ධා

05. **ද්වි ශබ්දය** සම්බන්ධයෙන් <u>**නිවැරදි**</u> ප්‍රකාශය වන්නේ,

1) ලිංගත්‍රයේ ඒක වචනයේ පමණක් වරනැගේ.
2) ලිංගත්‍රයේ බහු වචනයේ පමණක් වරනැගේ.
3) නපුංසක ලිංග ඒක වචනයේ පමණක් වරනැගේ.
4) ඉත්ථිලිංග ඒක වචනයේ පමණක් වරනැගේ.

06. **24 හා 56** යන සංඛ්‍යා <u>**නිවැරදිව**</u> පාලියෙන් ප්‍රකාශ වන වරණය තෝරන්න.

1) ඡත්තිංසති, පඤ්චපඤ්ඤාසති. 2) ඡ පඤ්ඤාසති, චතුවීසති.
3) ඡබ්බීසති, පඤ්චපඤ්ඤාසති. 4) චතුවීසති, ඡපඤ්ඤාසති.

07. <u>**ජගාම**</u> යනු,

1) සමාස පදයකි. 2) තද්ධිත පදයකි. 3) ආඛ්‍යාත පදයකි. 4) කිතක පදයකි.

08. කාරක ගණයට **නොගැනෙන** විභක්ති දෙක ඇතුළත් වරණය වන්නේ,

1) ෂට්ඨී හා කරණ විභක්ති දෙක යි.
2) පඤ්චමී හා ආලපන විභක්ති දෙක යි.
3) චතුත්ථී හා ෂට්ඨී විභක්ති දෙක යි.
4) ෂට්ඨී හා ආලපන විභක්ති දෙක යි.

09. ''තස්මිං සමයෙ භගවා අවොච''. මෙම වාක්‍යයෙහි **තස්මිං සමයෙ** යනු,

1) කාලාර්ථයයි.
2) ක්‍රියා ප්‍රවර්ගාර්ථයයි.
3) හේත්වර්ථයයි.
4) තාදර්ථයයි.

10. **උසභසතානි** යනු,

1) එළුවන් සියයකි.
2) වස්සන් සියයකි.
3) වැස්සියන් සියයකි.
4) ගොනුන් සියයකි.

11. ආඛ්‍යාත සම්බන්ධයෙන් **වැරදි** ප්‍රකාශය තෝරන්න,

1) කාලත්‍රයක් ඇත.
2) පුරුෂත්‍රයක් ඇත.
3) කාරකත්‍රයක් ඇත.
4) ලිංගත්‍රයක් ඇත.

12. චතුත්ථී නාම විභක්ති ප්‍රත්‍ය මාලාව වන්නේ,

1) සි - යො
2) අං - යො
3) නා - හි
4) ස - නං

13. ධම්මසංගණී ප්‍රකරණයට ලියූ අටුවාව වන්නේ,

1) පපඤ්චසූදනීය වේ.
2) අත්ථසාලිනීය වේ.
3) සාරත්ථප්පකාසිනීය වේ.
4) මනොරථපූරණීය වේ.

14. ගබ්භිනී සූත්‍රය,

1) නන්ද වග්ගයේ 3 වන සූත්‍රයයි.
2) චූල වග්ගයේ 6 වන සූත්‍රයයි.
3) බෝධි වග්ගයේ 8 වන සූත්‍රයයි.
4) මුචලින්ද වග්ගයේ 6 වන සූත්‍රයයි.

15. **මාතුච්ඡා** යනු,

1) මවගේ මවයි.
2) නැගණියයි.
3) සුළු මවයි.
4) භික්ෂුණියයි.

16. "**ආසීවිසාලයසමෙ**" යන්නෙන් අදහස් වන්නේ,

1) සර්පයන්ගේ ආදරය වැනිය යන්නයි.
2) සර්පයන්ට කිරි පෙවීම වැනිය යන්නයි.
3) ප්‍රේමයට ආශිර්වාද කළ යුතු කාලය යන්නයි.
4) සර්පයන් වසන තුඹසක් සමාන වූ යන්නයි.

17. **අපි පාසලට ගියෙමු.** මෙම වාක්‍ය පාලියෙන් නැගූ විට නිවැරදි වරණය වන්නේ,

1) මයං පාඨාලයං ගච්ඡාම.
2) මයං පාඨාලයං ගච්ඡිස්සාම.
3) මයං පාඨාලයං ගච්ඡිම්හා.
4) මයං පාඨාලයං ගච්ඡෙය්‍යාම.

18. නිවැරදි අකාරාදි පිළිවෙළ ඇති වරණය තෝරන්න,

1) ඉදභික්ඛවෙ, එකස්මිං, අතීතො, එතදග්ගං
2) එතදග්ගං, අතීතො, එකස්මිං, ඉදභික්ඛවෙ
3) අතීතො, ඉදභික්ඛවෙ, එකස්මිං, එතදග්ගං
4) අතීතො, ඉදභික්ඛවෙ, එතදග්ගං, එකස්මිං

19. "ආබ්‍රහ්මලොකා සද්දො අබ්භුග්ගච්ඡති." යන වාක්‍යයෙහි **ආබ්‍රහ්මලොකා** යන පදය යෙදී ඇත්තේ,

1) පඤ්චමී විභක්තියෙනි. 2) සත්තමී විභක්තියෙනි.
3) තතියා විභක්තියෙනි. 4) චතුත්ථී විභක්තියෙනි.

20. සමාස පද පමණක් ඇතුළත් වරණය වන්නේ,

1) සොරතා, යදිදං, දක්ඛා, කුදිට්ඨී 2) නිවාතා, දක්ඛා, උපසන්තා, අනලසා
3) පාවචනං, කුදිට්ඨී, අධිත්ථී, උපහටබලි 4) අනලසා, උපසන්තා, දිවාතරං, සයති

21. **අජ්ජතනී ආඛ්‍යාත විභක්තියෙහි** සරල අදහස වන්නේ,

1) අණ කිරීම හා ආශිර්වාද කිරීමයි. 2) සමීප අතීත කාලයයි.
3) සිදු නොවූ අතීත කාලයයි. 4) අප්‍රත්‍යක්ෂ අතීත කාලයයි.

22. **අබ්භුග්ගතො** යන්නෙහි **නිවැරදි** පද බෙදීම වන්නේ,

1) අභි + උග්ගතො 2) අභි + උ + ගතො
3) අභි + ගතො 4) අබ්භ + උග්ගතො

23. **බොල** යන තේරුම **නොයෙදෙන** වචනය ඇතුළත් වරණය තෝරන්න,

1) රෙ 2) හරෙ 3) ජෙ 4) ඔරං

24. **අයිතිය** ප්‍රකාශ කරන නාම විභක්තිය වන්නේ,

1) චතුත්ථී විභක්තියෙනි. 2) පඤ්චමී විභක්තියෙනි.
3) ඡට්ඨී විභක්තියෙනි. 4) සත්තමී විභක්තියෙනි.

25. සමාස පද ලිංග ලබන අයුරු සම්බන්ධයෙන් **වැරදි** ප්‍රකාශය ඇතුළත් වරණය තෝරන්න,

1) සමාහාර දිගු සමාසය නපුංසක ලිංග ඒක වචන වේ.
2) කම්මධාර සමාසය පූර්ව පදයේ ලිංගය භජනය කරයි.
3) තප්පුරිස සමාසය පරපදයේ ලිංගය භජනය කරයි.
4) බහුබ්බීහි සමාසය අන්‍ය පදයේ ලිංගය ගනී.

26. **ඉච්ඡිත කම්ම දුතියා විභක්තිය** සඳහා නිදසුනක් වන්නේ,

1) උපාසකො සීලං රක්ඛති. 2) දහරො විසං ගිලති.
3) වාණිජො ගාමං ගච්ඡන්තො රුක්ඛමූලං උපසංකමති. 4) යාචකො සෙට්ඨිං ධනං යාචති.

27. "න භජෙ පාපකෙ මිත්තෙ" යන්නෙහි **භජෙ** යනු,

1) පරොක්ඛා ආඛ්‍යාත පදයකි. 2) අජ්ජතනී ආඛ්‍යාත පදයකි.
3) භවිස්සන්ති ආඛ්‍යාත පදයකි. 4) සත්තමී ආඛ්‍යාත පදයකි.

28. **ඔ, යිර** යන විකරණ ප්‍රත්‍යය අයත් ධාතු ගණය වන්නේ,

1) භුවාදි ධාතු ගණය යි. 2) තනාදි ධාතු ගණය යි.
3) චුරාදි ධාතු ගණය යි. 4) දිවාදි ධාතු ගණය

29. අපදාන පාලියෙහි ඇති **සම්පූර්ණ** අපදාන සංඛ්‍යාව,

1) 592 කි. 2) 533 කි. 3) 596 කි. 4) 598 කි.

30. **ක්‍රියා විශේෂණ** යොදනු ලබන්නේ නපුංසක ලිංගිකව,

1) පඨමා හා තතියා විභත්තිවලිනි. 2) දුතියා හා තතියා විභත්තිවලිනි.

3) පඤ්චමී හා සත්තමී විභත්තිවලිනි. 4) චතුත්ථී හා ඡට්ඨී විභත්තිවලිනි.

31. කිංසු + ඉධ යන විසන්ධිය කිංසූධ යනුවෙන් සන්ධි කිරීමට අවශ්‍ය **බාලාවතාර සූත්‍රය** වන්නේ,

1) සරා සරෙ ලොපං 2) පරො වා සරො 3) පුබ්බො ච 4) සයෙ ච

32. ".......... චතුරො පෙතෙ .......... දීඝමාදිකෙ" යන පාඨයෙහි හිස්තැන් සඳහා යෝග්‍ය පද යුගලය වන්නේ,

1) ඨපෙත්වා - නිකායෙ 2) තදඤ්ඤං - ඛුද්දකෙ

3) ඛුද්දකෙ - බුද්ධවචනං 4) නිකායෙ - ඨපෙත්වා

33. "ආයන්තිං නාභිනන්දති" යන ගාථාව ඇතුළත් උදාන සූත්‍රය වන්නේ,

1) නන්ද සූත්‍රයයි. 2) සක්කාර සූත්‍රයයි. 3) සංගාමජි සූත්‍රයයි. 4) ගබ්භිනී සූත්‍රයයි.

34. පාලි භාෂා රීතිය අනුව අක්ෂර වින්‍යාසය **නිවැරදිව** යෙදී ඇති වරණය වන්නේ,

1) අන්තො ජඨා බහි ජඨා 2) ශීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො

3) සත්ථා දෙව මනුස්සානං 4) ස ශීලවා පඤ්ඤවා ධම්මිකො සියා

35. ටීකා ග්‍රන්ථ රචනා කරන ලද්දේ,

1) අනුරාධපුර යුගයේ දී ය. 2) පොළොන්නරු යුගයේ දී ය.

3) මහනුවර යුගයේ දී ය. 4) කුරුණෑගල යුගයේ දී ය.

36. බුද්ධඝෝෂ හිමි එනමින් ප්‍රකට වූයේ,

1) ත්‍රිපිටකයට අටුවා ලියූ නිසා ය. 2) බුදුරදුන්ගේ හඬට සමාන හඬක් තිබූ නිසා ය.

3) වාද කිරීමෙහි දක්ෂයෙකු වූ නිසා ය. 4) පැවිදි වීමේ දී ගුරු හිමියන් එම නම තැබූ නිසා ය.

37. "සම්පදානෙ චතුත්ථී" සඳහා නිදසුනක් **<u>රහිත</u>** වරණය වන්නේ,

1) සංඝස්ස චීවරං දදාති. 2) සමණස්ස සච්චං රොචතෙ.

3) යඤ්ඤදත්තස්ස ඡත්තං ධාරයතෙ. 4) අපසාලාය ආයන්ති වාණිජා.

38. උදාන පාලියෙහි ඇතුළත් **බණවර සංඛ්‍යාව** වන්නේ,

1) පහ හමාරකි. 2) හය හමාරකි. 3) හත හමාරකි. 4) අට හමාරකි.

39. පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් පැවිදි වූයේ,

1) 1999.11.02 දිනයි. 2) 1899.11.02 දිනයි. 3) 1889.11.02 දිනයි. 4) 1879.11.02 දිනයි.

40. A. සමන්තපාසාදිකා, B. මනොරථපූරනී, C. සාරත්ථප්පකාසිනී, D. පපඤ්චසූදනී
ඉහත සඳහන් ඒවායින් විනය පිටකය, මජ්ඣිම නිකාය, සංයුක්ත නිකාය හා අංගුත්තර නිකාය සඳහා කළ අටුවා **පිළිවෙළින් දැක්වෙන** වරණය වන්නේ,

1) A, D, C, B 2) A, B, C, D 3) D, A, B, C 4) C, D, A, B

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமை உடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

මධ්‍යවාර පරීක්ෂණය - 2023
இரண்டாம் தவணைப் பரீட்சை - 2023
Mid Year Term Test - 2023

පැය තුනයි

පාලි ii    විභාග අංකය : ............................................    5 ශ්‍රේණිය

❖ i කොටසේ ප්‍රශ්න සියල්ලට ද, ii කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

**I කොටස**

01. (අ) සිංහලට නගන්න.

තෙන ඛො පන සමයෙන රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස කොට්ඨාගාරෙ සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා සප්පිස්ස වා තෙලස්ස වා යාවදත්ථං පාතුං දියාති, නො නීහරිතුං. අථ ඛො තස්ස පරිබ්බාජකස්ස එතදහොසි. "රඤ්ඤො ඛො පන පසෙනදිස්ස කොසලස්ස කොට්ඨාගාරෙ සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා සප්පිස්ස වා තෙලස්ස වා යාවදත්ථං පාතුං දියාති, නො නීහරිතුං. යන්නූනාහං රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස කොට්ඨාගාරං ගන්ත්වා තෙලස්ස යාවදත්ථං පිවිත්වා සරං ආගන්ත්වා උග්ගිරිත්වාන දදෙය්‍යං යං ඉමිස්සා විජාතාය භවිස්සතී"ති. අථ ඛො සො පරිබ්බාජකො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස කොට්ඨාගාරං ගන්ත්වා තෙලස්ස යාවදත්ථං පිවිත්වා සරං ආගන්ත්වා නෙව සක්කොති උද්ධං කාතුං, න පන අධො. සො දුක්ඛාහි තිබ්බාහි ඛරාහි කටුකාහි වෙදනාහි ඵුට්ඨො ආවට්ටති, පරිවට්ටති.

(ලකුණු 6)

(ආ) සිංහලට නගන්න.

i. තස්ස ධම්මෙසු දායාදා ඔරසා ධම්මනිම්මිතා,
ගොතමී නාම නාමෙන හෙස්සති සත්ථුසාවිකා

ii. තස්ස බුද්ධස්ස මාතුච්ඡා ජීවිතාපාදිකා අයං,
රත්තඤ්ඤූනඤ්ච අග්ගත්තං භික්ඛුනීනං ලභිස්සති

iii. තං සුත්වාන පමුදිතා යාවජීවං තදා ජිනං,
පච්චයෙහි උපට්ඨිත්වා තතො කාලකතං අහං

(ලකුණු 6)

02. (අ) පාලියට නගන්න.

i. පවිටු මිතුරන් ඇසුරු නොකරන්නේ නම් මැනවි.
ii. පිං කරන පුද්ගලයා නිතර නිතර පිං කරයි.
iii. සෙන්පතියා යෝධයන් සමඟ නගරයෙන් නික්මෙයි.

(ලකුණු 2x3 = 6)

(ආ) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)**
Year End Term Test – 2021 (2022)

පැය තුනයි

**(02) පාලි - I** **5 වසර**

❖ සැලකිය යුතුයි.
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 01 බැගින් 40 කි.
- අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවල 1, 2, 3, 4 උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන උත්තරය තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ ( × ) ලකුණ යොදන්න.

(01) පාලි භාෂාවේ අසවර්ණ අක්ෂර දෙක වන්නේ,
(1) අ , ආ (2) ඉ , ඊ (3) උ , ඌ (4) එ , ඔ

(02) මොග්ගල්ලායන ව්‍යාකරණ සම්ප්‍රදායට අනුව පාලි අක්ෂර මාලාව ගණනින්,
(1) 41 කි. (2) 42 කි. (3) 43 කි. (4) 44 කි.

(03) අන්තස්ථාක්ෂර ඇතුළත් වරණය වන්නේ,
(1) ය, ර, ළ, ව (2) ය, ර, ල, ව (3) ස, හ, ළ, ව (4) ය, ස, ල, ව

(04) "ඔකණ්ඨොට්ඨජො" යන්නෙහි අදහස වන්නේ,
(1) ඔ තල්ලෙන් හා උගුරෙන් උපදී (2) ඔ උගුරෙන් හා තොල්වලින් උපදී
(3) ඔ තල්ලෙන් හා දත්වලින් උපදී (4) ඔ දත්වලින් හා උගුරෙන් උපදී

(05) "ස" යන්න විභක්ති ප්‍රත්‍යයක් වශයෙන් යෙදෙන විභක්ති දෙක වන්නේ,
(1) පඨමා හා ආලපන (2) දුතියා හා චතුත්ථී
(3) ඡට්ඨී හා පඤ්චමිය (4) චතුත්ථී හා ඡට්ඨිය

(06) 27 හා 47 යන සංඛ්‍යා නිවැරදිව පාලියෙන් ප්‍රකාශ කෙරෙන සංඛ්‍යා නාම ඇතුළත් වරණය තෝරන්න.
(1) සත්තවීසති , සත්තචත්තාළීසති (2) සත්තතිංසති , සත්තපඤ්ඤාසති
(3) සත්තසත්තති , සත්තචත්තාළීසති (4) සත්තාසීති , සත්තවීසති

(07) ඉච්ඡිත කම්ම , අනිච්ඡිත කම්ම යන ප්‍රභේද අයත් වනුයේ,
(1) දුතියා විභක්තියෙනි. (2) තතියා විභක්තියෙනි.
(3) චතුත්ථී විභක්තියෙනි. (4) පඤ්චමී විභක්තියෙනි.

(08) පඤ්චමී නාම විභක්තියට අයත් අර්ථයක් වන්නේ,
(1) ආධාරාර්ථය (2) කර්තෘ අර්ථය
(3) සම්ප්‍රදානාර්ථය (4) ආපදානාර්ථය

(09) පාලි භාෂාවේ ස්‍යාද්‍යන්ත පද යනුවෙන් හඳුන්වන්නේ,
(1) උපසර්ග පද යි. (2) ක්‍රියා පද යි. (3) නාම පද යි. (4) නිපාත පද යි.

(10) කම්මධාරය සමාසය සඳහා පමණක් නිදසුන් ඇති වරණය වන්නේ,

(1) පාවචනං , සුගන්ධො , තිලෝකං , චතුද්දිසං
(2) මහා විහාරො , ධම්මසඤ්ඤා , ගුණධනං , අසුරො
(3) අනිච්චසඤ්ඤා , කුදිට්ඨි , ජිනචරිතං , වනවාසො
(4) සාරිපුත්තත්ථෙරො , විකාලභොජනං , සුගන්ධො , අසුරො

(11) සාමඤ්ඤ තද්ධිතයට අයත් ප්‍රභේද ගණන,

(1) 2 කි. (2) 3 කි. (3) 4 කි. (4) 5 කි.

(12) පුත්‍රාර්ථය , ගෝත්‍රාර්ථය දක්වෙන තද්ධිත ප්‍රභේදයක් වන්නේ,

(1) අපච්චත්ථ තද්ධිතය යි. (2) අනෙකත්ථ තද්ධිතය යි.
(3) භාව තද්ධිතය යි. (4) අව්‍ය තද්ධිතය යි.

(13) තද්ධිත පදයක් සාදාගනු ලබන්නේ,

(1) නාම පද දෙකක් එක්වීමෙනි. (2) නාමයකට උපසර්ගයක් එක්වීමෙනි.
(3) ධාතුවකට තද්ධිත ප්‍රත්‍යයක් එක්වීමෙනි. (4) නාමයකට තද්ධිත ප්‍රත්‍යයක් එක්වීමෙනි.

(14) අව්‍ය තද්ධිත ප්‍රත්‍ය අඩංගු වරණය වන්නේ,

(1) ණ , ණායන , ණාන , ණෙය්‍ය (2) ණික , ණ , ඉම , ඉය
(3) තර , තම , ඉස්සික , ඉය (4) ක්ඛත්තුං , ධා , ථා , ත්ත

(15) ‘සත්ථා’ යන්නෙහි නිවැරදි අර්ථය වන්නේ.

(1) සතුරා ය. (2) ශාස්තෘ ය. (3) සත්වයා ය. (4) ආයුධ ය.

(16) ‘පුරාණදුතියිකා’ යනුවෙන් හඳුන්වන්නේ,

(1) පැරණි රජ දේවිය (2) පැරණි දූතයා ය.
(3) පෙර බිරිඳ ය. (4) පෙර දියණිය ය.

(17) ආඛ්‍යාත සම්බන්ධයෙන් සාවද්‍ය වරණය වන්නේ,

(1) කාලත්‍රයකි. (2) පුරුෂත්‍රයකි. (3) කාරකත්‍රයකි. (4) වචනත්‍රයකි.

(18) අතීත කාලය හඟවන ආඛ්‍යාත විභක්ති පමණක් ඇතුළත් වරණය වන්නේ,

(1) පඤ්චමී , සත්තමී , අජ්ජතනී , පරොක්ඛා ය.
(2) භවිස්සන්ති , කාලාතිපත්ති , හීයත්තනී , වත්තමානා ය.
(3) අජ්ජත්නී , කාලාතිපත්ති , හීයත්තනී , පරොක්ඛා ය.
(4) භවිස්සන්ති , වත්තමානා , සත්තමී , පඤ්චමී.

(19) ‘ආණත්‍යාසිට්ඨ්‍යනුත්තකාලෙ පඤ්චමී’ මෙහි නිවැරදි අර්ථ වනුයේ,

(1) අණකිරීම හා ආශිර්වාදය (2) අණකිරීම හා අනුමතිය
(3) අණකිරීම හා පරිකල්පනාර්ථය (4) අණකිරීම හා අපාදානාර්ථය

(20) තුමන්ත ක්‍රියා යනුවෙන් හඳුන්වන්නේ,

(1) මිශ්‍ර ක්‍රියා ය. (2) පූර්ව ක්‍රියා ය. (3) අපර ක්‍රියා ය. (4) ප්‍රයෝජ්‍ය ක්‍රියා

(21) අතීතකාල කෘදන්ත ප්‍රත්‍ය ඇතුළත් වරණය වන්නේ,

(1) අක , අන , ණී (2) ත , තාවී , භවන්තු (3) ණී , තු , තාවී (4) ත , තාවී , ආවි

(22) "**වන්‍දෙ** තං බෝධිපාදපං" මෙම ගාථා පාඨයේ ඉරි ඇඳි පදයේ ආඛ්‍යාත විභක්තිය වන්නේ,

(1) වත්තමානා ය. (2) සත්තමීය (3) පරොක්ඛාය (4) පඤ්චමීය

(23) ක්‍රියා විශේෂණයක් රහිත වරණය වන්නේ,

(1) සක්කච්චං , සුඛේන , සනිකං (2) සීසෙන , සාධුකං , නිබද්ධං

(3) සක්කච්චං , සීසෙන , සුඛං (4) ධිතිමා , දක්ඛො , සනිකං

(24) බුද්ධඝෝෂ හිමියන් දඹදිව දී ලියන ලද ප්‍රකරණ ග්‍රන්ථය තෝරන්න.

(1) සම්මොහවිනොදනී (2) අත්‍ථසාලිනී

(3) ඤාණෝදය (4) පරමත්‍ථජොතිකා

(25) තිවඞ්ගිකං යන පදය සන්‍ධි වී ඇත්තේ,

(1) වා පරො අසරූපා සූත්‍රයෙනි. (2) යමෙදන්තස්සාදෙසො සූත්‍රයෙනි.

(3) යවමදනතරලාචාගමා සූත්‍රයෙනි. (4) නිග්ගහීතංච සූත්‍රයෙනි.

(26) අපදාන පාලියට අටුවා ග්‍රන්ථයක් රචනා කරන ලද්දේ,

(1) උපසේන හිමියන් ය. (2) මහානාග හිමියන් ය.

(3) බුද්ධදත්ත හිමියන් ය. (4) ධම්මපාල හිමියන් ය.

(27) "රහොගතාය" යන්නෙහි අර්ථය වන්නේ,

(1) රාත්‍රිය ඉක්මගියේය යන්න යි. (2) රහසේම ගියේය යන්න යි.

(3) විවේකීව විසීම යන්න යි. (4) වයසින් වැඩි යන්න යි.

(28) මහාප්‍රජාපතීගෝතමී අපදානය ඇතුළත් වන්නේ,

(1) සුමේධා වර්ගයට ය. (2) එකූපෝසථික වර්ගයට ය.

(3) කුණ්ඩලකේසී වර්ගයට ය. (4) ඛත්තියා වර්ගයට ය.

(29) අභිධර්ම පිටකය හඳුන්වන විශේෂ නාමය තෝරන්න.

(1) ආණා දේශනා (2) වොහාර දේශනා

(3) පරමත්‍ථ දේශනා (4) ප්‍රාතිමෝක්ෂ දේශනා

(30) සිහළට්ඨකථාවක් නොවන්නේ,

(1) පච්චරියට්ඨකථාව (2) අන්‍ධට්ඨකථාව

(3) කුරුන්දි අට්ඨකථාව (4) මහාට්ඨකථාව

(31) බුද්ධඝෝෂ හිමියන්ගේ ජීවන තොරතුරු දැක්වෙන සාහිත්‍ය මූලාශ්‍රය තෝරන්න.

(1) ථූපවංසය , ජිනචරිතය (2) උදාන , අපදාන

(3) මහාවංසය , බුද්ධඝොසුප්පත්ති (4) ධම්මපදය , ජාතක පාලි

(32) බුද්ධඝෝෂ හිමියන්ගේ ගුරුවරයා ලෙස සැලකෙන්නේ,

(1) බුද්ධදත්ත හිමියන් ය. (2) රේවත හිමියන් ය.

(3) මහනාම හිමියන් ය. (4) ධම්මපාල හිමියන් ය.

(33) සුමංගල විලාසනී දීඝනිකායට්ඨකථාව ලිවීමට ආරාධනා කරන ලද්දේ,

(1) බුද්ධමිත්ත තෙරුන් ය. (2) ජෝතිපාල තෙරුන් ය.

(3) සෝණ තෙරුන් ය. (4) දාඨානාග තෙරුන් ය.

(34) පාතිමොක්ඛ අටුවාව වන්නේ,

(1) කඞ්ඛාවිතරණී (2) පපඤ්චසූදනී (3) සුමංගල විලාසනී (4) සමන්තපාසාදිකා

(35) පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් ජන්මලාභය ලැබුයේ,

(1) නැගෙනහිර පළාතේ ය. (2) ඌව පළාතේ ය.

(3) දකුණු පළාතේ ය. (4) බස්නාහිර පළාතේ ය.

(36) ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථයක් නොවන්නේ,

(1) ජාතක (2) බුද්ධවංස (3) සුත්තනිපාත (4) ධාතුකථා

(37) උදාන පාලියේ මුළු සූත්‍ර ගණන,

(1) 81 කි. (2) 82 කි. (3) 83 කි. (4) 84 කි.

(38) රීස් ඩේවිඩ්ස් පඬිතුමා උපත ලැබුයේ,

(1) ඉන්දියාවේ ගුජරාට් ප්‍රාන්තයේ ය. (2) එංගලන්තයේ කොල්චෙස්ටර්හි ය.

(3) ඕස්ට්‍රේලියාවේ මෙල්බන් නුවර ය. (4) ඇමරිකාවේ නිව්යෝර්ක්හි ය.

(39) දිඹුලාගල කාශ්‍යප හිමියන් වැඩසිටියේ,

(1) අනුරාධපුර යුගයේ ය. (2) පොළොන්නරු යුගයේ ය.

(3) දඹදෙණි යුගයේ ය. (4) කුරුණෑගල යුගයේ ය.

(40) A - මොහවිච්ඡෙදනී B - අභිධර්මත්‍ථපුරාණ ටීකා

C - මනොරථපූරණීටීකා D - සාරත්‍ථදීපනීටීකා

ඉහත සඳහන් ඒවායින් දිඹුලාගල කාශ්‍යප හිමියන් විසින් සම්පාදනය කරන ලද ටීකා යුගලය වන්නේ,

(1) A සහ B ය. (2) B සහ D ය. (3) C සහ D ය. (4) A සහ C ය.

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව**
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி இராஜாங்க அமைச்சு - பிரிவேனா கல்விக் கிளை
State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

**වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)**
Year End Term Test – 2021 (2022)

**පැය තුනයි**

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.**

**(02) පාලි - II** **5 වසර**

❖ I කොටසේ ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස

(01) (අ) සිංහලට නගන්න.

අථ ඛො භගවා ආයස්මන්තං නන්‍දං බාහාය ගහෙත්වා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව ජෙතවනෙ අන්තරහිතො දෙවෙසු තාවතිංසෙසු පාතුරහොසි. තෙන ඛො පන සමයෙන පඤ්චමත්තානි අච්ඡරාසතානි සක්කස්ස දෙවානමින්‍දස්ස උපට්ඨානං ආගතානි හොන්ති කකුටපාදානි. අථ ඛො භගවා ආයස්මන්තං නන්‍දං ආමන්තේසි 'පස්සසි නො ත්වං නන්‍ද; ඉමානි පඤ්ච අච්ඡරාසතානි කකුටපාදානී?' ති. 'එවං භන්තෙ'ති. 'තං කිං මඤ්ඤසි නන්‍ද, කතමා නු ඛො අභිරූපතරා ච දස්සනීයතරා ච පාසාදිකතරා ච, සාකියානී වා ජනපදකල්‍යාණී, ඉමානි වා පඤ්ච අච්ඡරසාතානි කකුටපාදානී?' ති. 'සෙය්‍යථාපි භන්තෙ පලුට්ඨමක්කටී කණ්ණනාසච්ඡින්නා. එවමෙව ඛො භනෙත සාකියානි ජනපදකල්‍යාණී ඉමෙසං පඤ්චන්නං අච්ඡරාසතානං උපනිධාය සඞ්කම්පි න උපෙති.

(ලකුණු 06)

(ආ) සිංහලට නගන්න.

කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගීව බන්‍ධනං ඡෙත්වා විහරාමි අනාසවා.

ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

(ලකුණු 06)

(02) (අ) පාලියට නගන්න.

(i) ගුණවත් උපාසිකාවෝ විහාරයට ගොස් එකත්පසෙක හුන්නාහ.

(ii) ඉදින් ඔහු පැවිදි වන්නේ නම් රහත් බව ලබන්නේ ය.

(iii) ප්‍රමාද නොවූ තැනැත්තා නොමියත්.

(ලකුණු 06)

(අ) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සෙතව්‍යාවාසිනො හි චූලකාලො මජ්ඣිමකාලො මහාකාලොති තයො භාතරො කුටුම්බිකා. තෙසු ජෙට්ඨකනිට්ඨා දිසාසු විචරිත්වා සකටෙහි භණ්ඩං ආහරන්ති. මජ්ඣිමකාලො ආහතං වික්කිණාති. අථෙකස්මිං සමයෙ තෙ උභොපි භාතරො පඤ්චහි සකටසතෙහි නානා භණ්ඩං ගහෙත්වා සාවත්ථිං ගන්ත්වා සාවත්ථියා ච ජෙතවනස්ස ච අන්තරෙ සකටානි මොචයිංසු. තෙසු මහාකාලො සායණ්හසමයං මාලාගන්ධාදිහත්ථෙ සාවත්ථිවාසිනො අරියසාවකෙ ධම්මසවණත්ථාය ගච්ඡන්තෙ දිස්වා "කුහිං ඉමෙ ගච්ඡන්තී" ති පුච්ඡිත්වා තමත්ථං සුත්වා 'අහම්පි ගමිස්සාමී'ති චින්තෙත්වා කනිට්ඨං ආමන්තෙත්වා, "තාත සකටෙසු අප්පමත්තො හොහි. අහං ධම්මං සොතුං ගච්ඡාමී"ති වත්වා තථාගතං වන්දිත්වා පරිසපරියන්තෙ නිසීදි. සත්ථා තං දිස්වා අජ්ඣාසයවසෙන ආනුපුබ්බිකථං කථෙන්තො දුක්ඛක්ඛන්ධසුත්තාදිවසෙන අනෙකපරියායෙන කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං ච කථෙසි.

(i) පෙර සැවැත්නුවර වැසියෝ සවස් කාලයෙහි කුමක් කළාහුද?
(ii) පරලොව යන්නෝ ගෙන නොයන දේ මොනවා ද?
(iii) සැදැහැසිත් ඇතිවන හේතු දෙකක් ඡේදය ඇසුරෙන් පෙන්වා දෙන්න.
(iv) අතීතයේ පැවති වෙළෙඳාම පිළිබඳ ඡේදයේ එන තොරතුරු දෙකක් ලියන්න.

(ලකුණු 1 + 1 + 2 + 2 = 06)

## II කොටස

(03) (අ) නිග්ගහීතය හඳුන්වන බාලාවතාර ගාථාව ලියන්න.

(ආ) "වොදන්තොට්ඨජො" යන පාඨයේ සිංහල අර්ථය ලියන්න.

(ඉ) පහත සඳහන් පද විසන්ධි කර සන්ධි වර්ගය නම් කරන්න.

(i) එතදවොච (ii) පුනරෙව (iii) ඡායාව
(iv) ඉදභික්ඛවෙ (v) සභික්ඛු (vi) එසධම්මො

(ලකුණු 2 + 4 + 6 = 12)

(04) (අ) "සාමිස්මිං ජට්ඨී" යන සූත්‍රයේ අර්ථය ලියා නිදසුනක් සපයන්න.

(ආ) පහත සඳහන් පදවල අර්ථය ලියා විභක්තිය නම් කරන්න.
(i) අජගරො (ii) සල්ලකා (iii) මඤ්චස්මිං (iv) සකටෙසු

(ඉ) පහත දැක්වෙන පදයන්හි සමාසය නම් කරන්න.
(i) සාරිපුත්තත්ථෙරො (ii) තිලොකං (iii) විජිතමාරො
(iv) මාතාපිතරො (v) දිට්ඨධම්මො (vi) චතුසච්චං

(ලකුණු 2 + 4 + 6 = 12)

(05) (අ) කම්මධාර සමාසයෙහි ප්‍රභේද දෙකක් නම් කරන්න.

(ආ) පහත සඳහන් පදවල තද්ධිත ප්‍රත්‍ය වෙන්කර දක්වන්න.
(i) සාතික (ii) සාකටික (iii) පාපතර (iv) මෙධාවී

(ඉ) පහත සඳහන් මාතෘකාවලින් එකකට අදාලව වාක්‍ය හයක් ලියන්න.
(i) අම්හාකං පරිවෙණං (ii) ලංකාදීපං (iii) දුමින්දාගමනං (iv) පණ්ණසාලං

(ලකුණු 2 + 4 + 6 = 12)

(06) (අ) පහත සඳහන් පද පාලියෙන් ලියන්න.

(i) උදෑසන (ii) ඊයේ

(ආ) පහත වාක්‍ය යුගල පූර්වක්‍රියා යොදා තනි වාක්‍ය ලෙසින් ලියන්න.

(i) සාමණෙරො පුප්ඵං ඔචිනාති, සො බුද්ධං වන්‍දති.

(ii) කුමාරො ධම්මං සුණාති, සො ධම්මෙන ජීවති.

(iii) මයං පරිවෙණං ගච්ඡාම, මයං තත්‍ථ පාලිභාසං උග්ගණ්හාම.

(iv) ථෙරො පාතොව පබුජ්ඣති, සො මුඛං ධොවති.

(ඉ) උපසර්ග පද හයක් ලියා ඊට ගැලපෙන සේ වචන හයක් ලියන්න.

(ලකුණු 2 + 4 + 6 = 12)

(07) (අ) බුද්ධඝෝෂ හිමියන් ලියූ අට්ඨකතා දෙකක් නම් කරන්න.

(ආ) පහත සඳහන් අට්ඨකථා ලියූ තෙරුන් වහන්සේලාගේ නම් ලියන්න.

(i) පරමත්‍ථ දීපනී

(ii) විසුද්ධිජන විලාසිනී

(iii) මධුරත්ථප්පකාසිනී

(iv) සද්ධම්මපජ්ජෝතිකා

(ඉ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට සුදුසු ක්‍රියාපද වරහන් තුළින් තෝරා නැවත ලියන්න.

**(යන්තු / පරියාපුණාථ / පහට්ඨහංසු / නික්කුජ්ජෙය්‍යුං / කරොහි /සම්මොදිංසු / භාවෙය්‍ය)**

(i) අසෙසා විලසං ………………………. අනන්තගුණ තෙජසා.

(ii) ……………………………. භික්ඛවෙ ආටානාටියං රක්ඛං.

(iii) ඉති ඉමා චතුරාරක්ඛා භික්ඛු ……………………………… සීලවා.

(iv) අප්පෙකච්චෙ භගවතා සද්ධිං …………………………….. .

(v) …………………………….. තස්ස උපට්ඨානං ඛත්තියා බ්‍රාහ්මණා බහූ.

(vi) ඛීණාසවා අන්නෙන පානෙන ……………………………. .

(ලකුණු 2 + 4 + 6 = 12)

(08) (අ) ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

(ආ) උදාන යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(ඉ) ගබ්භිණී සූත්‍රයේ අන්තර්ගතය කෙටියෙන් ලියා ගත හැකි ආදර්ශය පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 4 + 6 = 12)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**වර්ෂාවසාන වාර පරීක්ෂණය - 2022 (2023)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2022 (2023)**
Year End Term Test – 2022 (2023)

පැය එකයි

**පාලි - I** **5 ශ්‍රේණිය**

සැලකිය යුතුයි.

- ❖ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 01 බැගින් 40 කි.
- ❖ අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවල 1, 2, 3, 4 උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන උත්තරය තෝරන්න.
- ❖ ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ ( × ) ලකුණ යොදන්න.

01. භාෂාවක් නිවැරදිව ලිවීමට හා උච්චාරණය කිරීමට වඩා වැදගත් වන්නේ,

(1) ඡේද ය. (2) වාක්‍ය ය. (3) පද ය. (4) අක්ෂර ය.

02. 'ද්විජාක්ෂරයක්' නොවන්නේ,

(1) ඔ කාරය. (2) ව කාරය. (3) ය කාරය. (4) එ කාරය.

03. 'සත්ථා' යන්නෙහි නිවැරදි අර්ථය වන්නේ,

(1) සතුරා ය. (2) ශාස්තෘ ය. (3) සත්ත්වයා ය. (4) ආයුධය ය.

04. නිවැරදි අකාරාදි පිළිවෙල ඇතුළත් වරණය වන්නේ

(1) ඉදමාසනං, එකපුණ්ඩරික, අතිප්පගො, එතදවොච
(2) එතදවොච, අතිප්පගො, එකපුණ්ඩරික, ඉදමාසනං
(3) අතිප්පගො, ඉදමාසනං, එකපුණ්ඩරික, එතදවොච
(4) අතිප්පගො, ඉදමාසනං, එතදවොච, එකපුණ්ඩරික

05. 'මම පිරිවෙණට යන්නෙමි' මෙම වාක්‍ය පාලියෙන් ලියූ කල නිවැරදි වර්ණය වන්නේ,

(1) මම පරිවෙණං ගච්ඡාමි (2) අහං පරිවෙණං ගච්ඡාම
(3) අහං පරිවෙණං ගමිස්සාමි (4) අහං පරිවෙණං ගච්ඡති

06. සමාස පදවල පවත්නා මූලික ලක්ෂණයක් **නොවන්නේ,**

(1) නාමයක් හා ආඛ්‍යාත පදයක් සමාස වීම යි.

(2) පද කෙටිවීම යි.

(3) එක් පදයක් බවට පත්වීම යි.

(4) එක් විභක්ත්‍යන්ත පදයක් බවට පත්වීම යි.

07. '**සූදො ඔදනං පචති**' වාක්‍ය කර්මකාරකයට හැර වූ විට නිවැරදි වර්ණය වන්නේ,

(1) සූදෙන ඔදනං පචති (2) සූදො ඔදනො පච්චතෙ

(3) සූදෙන ඔදනො පච්චතෙ (4) සූදො ඔදනං පච්චතෙ

08. ආඛ්‍යාත පද සම්බන්ධයෙන් **වැරදි** ප්‍රකාශයක් වන්නේ,

(1) කාලත්‍රයක් වේ යන්න යි. (2) වචනත්‍රයක් වේ යන්න යි.

(3) පුරුෂත්‍රයක් වේ යන්න යි. (4) කාරකත්‍රයක් වේ යන්න යි.

09. නාම විභක්ති **පඨමා ප්‍රත්‍ය මාලාව** වන්නේ,

(1) සි - යො (2) අං - යො (3) නා - හි (4) ස - නං

10. කර්මකාරක වාක්‍ය සම්බන්ධයෙන් **නිවැරදි** වර්ණය වන්නේ,

(1) අනුක්ත කර්තෘ තතියාවෙන් තැබේ.

(2) කර්මය දුතියාවෙන් තැබේ.

(3) ක්‍රියාව කර්තෘ කාරක ක්‍රියා ලෙස තැබේ.

(4) අනුක්ත කර්තෘ පඨමාවෙන් තැබේ.

11. '**මුනිසීහො**' සමාස පදය කම්මධාර සමාසයේ,

(1) විශේෂණ පූර්ව පද කම්මධාර සමාසයට අයත් වේ.

(2) විශේෂණ උත්තර පද කම්මධාර සමාසයට අයත් වේ.

(3) උපමා උත්තර පද කම්මධාර සමාසයට අයත් වේ.

(4) අවධාරණ පූර්ව පද කම්මධාර සමාසයට අයත් වේ.

12. වත්තමාන ආඛ්‍යාත විභක්තියේ සරල අදහස වන්නේ,

(1) අණ කිරීම හා ආශිර්වාද කිරීම යි. (2) අප්‍රත්‍යක්ෂ වූ අතීතය යි.

(3) සිදු නොවූ අතීත සිද්ධිය යි. (4) පවත්නා කාලය යි.

13. අව්‍ය කිතක පද යනුවෙන් හඳුන්වන්නේ,

(1) මිශ්‍ර ක්‍රියා ය. (2) ආශිර්වාද ක්‍රියා ය.

(3) තුමන්ත ක්‍රියා ය. (4) ප්‍රයෝජ්‍ය ක්‍රියා ය.

14. මහා විජයබාහු රජතුමා සම්බන්ධව **සාවද්‍ය** ප්‍රකාශය වන්නේ,

(1) උපසම්පදා පුණ්‍ය කර්මය නැවත මෙරටෙහි ඇති කිරීම යි.

(2) තුන් නිකාය සමගි කරවීම යි.

(3) වෙහෙර විහාරස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම යි.

(4) මහාවිහාරය විනාශ කිරීම යි.

15. **'තදඤ්ඤං ............. නිකායො ............මතො'** හිස්තැනට ගැළපෙන යුගල පාඨය දැක්වෙන වර්ණය වන්නේ,

(1) බුද්ධවචනං , ඛුද්දකො

(2) ඛුද්දකො , බුද්ධවචනං

(3) චතුරොපෙතෙ , දීඝමාදිකෙ

(4) දීඝමාදිකෙ , චතුරොපෙතෙ

16. ස්වර සන්ධියට **අයත් නොවන** සන්ධි පදයක් සහිත වරණය වන්නේ,

(1) කිංසූධ , නොපෙති , යානීධ , ඉදාහං

(2) ඡායාව , යථරිව , ස්වස්ස , අනෙවති

(3) වුත්ත්‍යස්ස , ත්‍යජ්ජ , ගංගොදය , බන්ධුස්සෙව

(4) පගෙව , පච්චන්තං , අබ්භුග්ගතො , අක්ඛාතං

17. ආඛ්‍යාත පදයක් නිර්මාණය වීමේදී විකරණ ප්‍රත්‍යය යෙදෙනුයේ,

(1) ධාතුවට පූර්වයෙනි.

(2) ධාතුවට පසු ආඛ්‍යාත ප්‍රත්‍යයට මුලිනි.

(3) ආඛ්‍යාතයට පසුවය.

(4) ඉහත පිළිතුරු එකක් හෝ නොවේ.

18. **'කම්මත්ථෙ දුතියා'** සඳහා නිදසුනක් **රහිත** වර්ණය වන්නේ,

(1) කුමාරො භත්තං භුඤ්ජති (2) රාජා ආසනෙ නිසීදි

(3) සාමණෙරො ලෙඛනං ලිඛති (4) මාතා පුප්ඵානි ඔචිනාති

19. **සොමනස්සඤාණමයිකඤ්ච ........................... ද්වෙ අසීති සුත්තන්තා උදානන්ති වෙදිතබ්බං** මෙහි හිස් තැනට යෙදිය යුතු පදය වන්නේ,

(1) ගාථාපටිසංයුත්තා (2) දීඝමාදිකෙ (3) කෙනත්ථෙන (4) බුද්ධවචනං

20. **සුඛිනො ....... යෙ අකිඤ්චනා ............ හි ජනා අකිඤ්චනා** යන පාඨයේ හිස්තැන් සඳහා යෝග්‍ය පද යුගල වන්නේ,

(1) ධම්මො - සංඝො (2) වත - වෙදගුණො

(3) ජාතා - දුක්ඛා (4) සත්තා - තිරච්ඡානා

21. **තප්පුරිස සමාසය** සඳහා උදාහරණයක් වන්නේ,

(1) චතුද්දිසං (2) ජිනචරිතං (3) ජිතින්ද්‍රියො (4) පාවචනං

22. **පඤ්චමී විභක්තියට** අයත් අර්ථයක් වන්නේ,

(1) ආධාරාර්ථය (2) කර්තෘ අර්ථය (3) සම්ප්‍රදානාර්ථය (4) අපාදානාර්ථ

23. **'ආයන්තිං නාභිනන්දන්තී'** යන ගාථාව ඇතුළත් උදාන සූත්‍රය වන්නේ,

(1) සංගාමජි සූත්‍රය යි. (2) ගබ්භිනී සූත්‍රය යි.

(3) නන්ද සූත්‍රය යි. (4) උදපාන සූත්‍රය යි.

24. පාලි භාෂාවේ සමාස ප්‍රභේද ගණන

(1) 04 කි. (2) 05 කි. (3) 06 කි. (4) 08 කි.

25. **කරොති ................................ නිප්ඵාදෙතීති ................................** හිස්තැන සඳහා අවශ්‍ය පද යුගලය ඇතුළත් වරණය වන්නේ,

(1) කිරියං - කාරකං

(2) කම්මං - කරණං

(3) අපදානං - සම්පදානං

(4) කිරියං - කම්මං

26. පාලි භාෂා රීතිය අනුව අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති වර්ණය වන්නේ,

(1) ජන්දා ද්වේෂා භයා මෝහා

(2) ස ශීලවා පඤ්ඤවා ධම්මිකෝ සියා

(3) තිස්සෝ විද්‍යා අනුප්පතා

(4) න සමිඤ්ජන්ති පණ්ඩිතා

27. **'බීජං+ඉව'** යන විසන්ධිය **'බීංජව'** යනුවෙන් සන්ධි කිරීමට අවශ්‍ය බාලාවතාර සූත්‍රය වන්නේ,

(1) නිග්ගහීතඤ්ච (2) බ්‍යඤ්ජනෙ චෙ (3) පරො වා සරො (4) සයෙ ච

28. '**දෙවො <u>වස්සතු</u> කාලෙන**' මෙහි ඉරි ඇඳි පදයේ ක්‍රියා විභක්තිය වන්නේ,

(1) පරොක්ඛා ආඛ්‍යාත විභක්තිය යි.

(2) සත්තමී ආඛ්‍යාත විභක්තිය යි.

(3) අජ්ජතනි ආඛ්‍යාත විභක්තිය යි.

(4) පඤ්චමී ආඛ්‍යාත විභක්තිය යි.

29. '**ඉච්ඡිත කම්ම දුතියා විභක්තිය**' සඳහා නිදසුනක් **නොවන්නේ,**

(1) කුමාරො බුද්ධං වන්දති
(2) උපාසකො දානං දෙති
(3) දහරො කණ්ඨකං මද්දති
(4) භික්ඛු පොත්ථකං පඨති

30. '**එවම්මං**' පදයට නිවැරදිව විසන්ධිය දක්වා ඇති වර්ණය වන්නේ,

(1) එවම් + මං (2) එවං + ඉමං (3) එව + මිමං (4) එවං + මිමං

31. '**පුත්‍රාර්ථය, ගෝත්‍රාර්ථය**' දැක්වෙන තද්ධිත ප්‍රභේදය වන්නේ,

(1) අපච්චත්ථ තද්ධිතය
(2) අනෙකත්ථ තද්ධිතය
(3) භාව තද්ධිතය
(4) අව්‍යය තද්ධිතය

32. '**අකර්මක ධාතු**' ඇතුළත් වර්ණය වන්නේ,

(1) හස , කන්‍ද , ජර , රුජ
(2) ලිඛ , පඨ , ඣන්‍ද , පූජ
(3) හස , ලිඛ , ගමු , වන්‍ද
(4) ඣන්‍ද , රුජ , මුච , පච

33. '**පාපතර, පාපිස්සික, පාපිට්ඨ, පාපතම**' ආදි තද්ධිත පද ඇතුළත් විය යුතු වර්ණය වන්නේ,

(1) අනෙකත්ථ තද්ධිතයට ය.
(2) භාව තද්ධිතයට ය.
(3) අත්ථ්‍යත්ථ තද්ධිතයට ය.
(4) සංඛ්‍යා තද්ධිතයට ය.

34. වර්තමාන කිතක ප්‍රත්‍යය සහිත වර්ණය වන්නේ,

(1) මාන, අන්ත (2) තුන, ත්වාන (3) ම්ම, ය්හ (4) තබ්බ, අනීය

35. **තම්මිත්තං** යන සන්‍ධි පදය අයත් වන්නේ,

(1) නිග්ගහීත සන්‍ධියට ය.
(2) ව්‍යඤ්ජන සන්‍ධියට ය.
(3) වො මිස්සක සන්‍ධියට ය.
(4) ස්වර සන්‍ධියට ය.

36. '**ණ්හ, ප්ප**' **විකරණ ප්‍රත්‍යය** අයත් වන ධාතු ගණය වන්නේ,

(1) කියාදි ගණය (2) තනාදි ගණය (3) චුරාදි ගණය (4) ගහාදි ගණය

37. '**රාජා <u>ආසනෙ</u> නිසීදති**' ඉරි ඇඳි පදයේ විභක්තිය වන්නේ,

(1) පඤ්චමී විභක්තිය යි. (2) චතුත්ථී විභක්තිය යි.

(3) සත්තමී විභක්තිය යි. (4) දුතියා විභක්තිය යි.

38. A. සුමංගවිලාසිනී

B. පපඤ්චසූදනී

C. මනොරථපූරණී

D. සාරත්ථප්පකාසනි

ඉහත සඳහන් ඒවායින් **දීඝ, මජ්ඣිම, සංයුත්ත සහ අංගුත්තර නිකායයන්** සඳහා කළ අටුවා පිළිවෙලින් දැක්වෙන වර්ණය වන්නේ,

(1) A B D C ය. (2) B C D A ය. (3) D A B C ය. (4) C A D B ය.

39. අතීත කෘදන්ත පමණක් ඇතුළත් වර්ණය වන්නේ,

(1) දිනකර, ධම්මධර, නිසින්න (2) යාචන, දාන, පුණ්ණ

(3) දාතු, පාලන, ආරද්ධ (4) භුත්ත, බද්ධ, පත්ත

40. '**විසාරදං තෙපිටකං - විනයඤ්ඤූ විසෙසතො**' යනාදි වශයෙන් වර්ණනාවට ලක් වන්නේ,

(1) දිඹුලාගල කාශ්‍යප හිමියන් ය.

(2) පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් ය.

(3) රීස් ඩේවිස් මැතිතුමා ය.

(4) බුද්ධඝෝෂ හිමියන් ය.

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**වර්ෂාවසාන වාර පරීක්ෂණය - 2022 (2023)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2022 (2023)**
Year End Term Test – 2022 (2023)

**පාලි - II** **5 ශ්‍රේණිය**

❖ I කොටසේ ප්‍රශ්න සියල්ලට ද, II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

01. (අ) පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජේතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං එතදවොච. "ආයස්මා භන්තෙ නන්දො භගවතො භාතා මාතුච්ඡපුත්තො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී'ති. භගවතො'පි ඛො ඤාණං උදපාදි. 'නන්දො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී'ති.

(ලකුණු 06)

(ආ) පහත සඳහන් ගාථා සිංහලට නගන්න.

ආකාසායතනඤ්චෙව විඤ්ඤාණායතනං තථා,
ආකිඤ්චඤ්ඤං නෙවසඤ්ඤං සමාපජ්ජි යථාක්කමං.

පටිලොමෙන ඣානානි සමාපජ්ජිත්ථ ගොතමී,
යාවතා පඨමං ඣානං තතො යාව චතුත්ථකං.

තතො වුට්ඨාය නිබ්බායි දීපච්චීව නිරාසනා,
භූමිචාලො මහා ආසි නභසා විජ්ජුතා පති.

(ලකුණු 2 × 3 = 6)

02. (අ) පාලියට නගන්න.

i. එම්බල කාළිය කුමක් හෙයින් දවල් වී නැගිට්ටා ද?

ii. දම්සක් පැවැත්වීමට කාසි පුරයට යමි.

iii. ඒකාන්තයෙන්ම මේ ප්‍රතිපත්තිය නිවන් පිණිසම පවතී.

(ලකුණු 06)

(ආ) ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තෙසු මහාකාලො සායණ්හසමයං මාලාගන්ධාදිහත්ථෙ සාවත්ථිවාසිනො අරියසාවකෙ ධම්මසවණත්ථාය ගච්ඡන්තෙ දිස්වා "කුහිං ඉමෙ ගච්ඡන්තී"ති පුච්ඡිත්වා තමත්ථං සුත්වා 'අහම්පි ගමිස්සාමී'ති චින්තෙත්වා කනිට්ඨං ආමන්තෙත්වා, "තාත සකටෙසු අප්පමත්තො හොහි. අහං ධම්මං සොතුං ගච්ඡාමී"ති වත්වා තථාගතං වන්දිත්වා පරිසපරියන්තෙ නිසීදි. සත්ථා තං දිස්වා අජ්ඣාසයවසෙන ආනුපුබ්බීකථං කථෙන්තො දුක්ඛක්ඛන්ධසුත්තාදිවසෙන අනෙකපරියායෙන කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං ච කථෙසි. තං සුත්වා මහාකාලො සබ්බං කිර පහාය ගන්තබ්බං, පරලොකං ගච්ඡන්තං නෙව භොගා න ඤාතයො අනුගච්ඡන්ති. කිම්මෙ ඝරාවාසෙන, පබ්බජිස්සාමීති චින්තෙසි.

i. පෙර සැවැත්නුවර වැසියෝ සවස් කාලයෙහි කුමක් කළාහු ද?

ii. පරලොව යන්නෝ ගෙන නොයන දේ මොනවා ද?

iii. අනුපිළිවෙළ කථාව යනු කුමක් ද?

iv. සැදැහැ සිත් ඇතිවන හේතු දෙකක් ඡේදය ඇසුරෙන් පෙන්වා දෙන්න.

(ලකුණු 1 + 1 + 2 + 2 = 6)

## II කොටස

03. (අ) එකාර ඔකාර උප්පත්ති ස්ථාන දැක්වෙන බාලාවතාර පාඨ ලියන්න.

(ආ) පහත සඳහන් සන්ධි පදවල සන්ධි ප්‍රභේදය නම් කරන්න.

| | |
|---|---|
| i. අන්වෙති | ii. තඤ්හි |
| iii. බීජංව | iv. පගෙව |
| v. ඡද්ධා | vi. සොත්ථී |
| vii. ඡායාව | viii. බුද්ධානුසාසනං |

(ඉ) පහත සඳහන් සූත්‍රවල අර්ථය ලියා උදාහරණය බැගින් ලියන්න.

i. වග්ගන්තං වා වග්ගෙ     ii. දීඝං

iii. වමොදුදන්තානං

(ලකුණු 2 + 4 + 6 = 12)

04. (අ) **'ඔකාසෙ සත්තමී'** යන සූත්‍රයේ අර්ථය ලියා ඊට නිදසුනක් ද සපයන්න.

(ආ) පහත සඳහන් පදවල විභක්තිය නම් කරන්න.

i. ගමා ii. ඔදනො iii. මඤ්චෙ iv. භික්ඛූනං

(ඉ) පහත සඳහන් පදයන්හි සමාසය නම් කරන්න.

i. පාවචනං ii. දෙවරාජා

iii. තිභවා iv. ජාතරූපරජතං

v. විජිතමාරො vi. යාවජීවං (ලකුණු 2 + 4 + 6 = 12)

05. (අ) තද්ධිත වලින් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

(ආ) පහත සඳහන් කිතක පදවල අර්ථය ලියන්න.

i. කත්තබ්බ ii. මාරිය iii. භච්ච iv. ගම්‍ය

(ඉ) පහත සඳහන් මාතෘකාවලින් එකකට අදාළව වාක්‍ය හයක් ලියන්න.

i. මහපජාපතිගොතමී ii. මම පණ්ණසාලං

iii. දුම්භාගමනං iv. මම මාතා

(ලකුණු 2 + 4 + 6 = 12)

06. (අ) පහත සඳහන් පද පාලියෙන් ලියන්න.

i. නැතහොත් ii. කීප දවසක්

(ආ) පහත වාක්‍යය යුගල තුමන්ත ක්‍රියා පද යොදා තනි වාක්‍යයක් සේ ලියන්න.

i. සාමණෙරො පරිවෙණං ගච්ඡති. / සො තත්‍ථ පාලිභාසං උග්ගණ්හාති.

ii. පුරිසො පාතොව ධූමරථෙන නගරං ගච්ඡති / සො නගරෙ කම්මං කරොති.

iii. භික්ඛවො පණ්ණරසියං උපොසථාගාරං ගච්ඡනති / තෙ තත්‍ථ විනයං වාචෙන්ති.

iv. කම්මකාරා වෙසාඛෙ පාටිපදියං සන්නිපතන්ති /තෙ තෙසං කම්මකාරදිවසං සමනුස්සරන්ති.

(ඉ) පහත සඳහන් බාලාවතාර සූත්‍ර සම්පූර්ණ කරන්න.

i. ........................................ චාගමා

ii. ........................................ තත්‍රාකාරො

iii. නාමානං සමාසො ..............................

iv. අපාදානෙ ........................................

v. අතීතෙ .................................... තාවි

vi. .................................. දුතියා

(ලකුණු 2 + 4 + 6 = 12)

07. (අ) කඞ්ඛාවිතරණී හා පරමත්ථදීපනී අටුවා ග්‍රන්ථ රචනා කළ ලේඛකයන් නම් කරන්න.

(ආ) පහත සඳහන් පෙළ ග්‍රන්ථවලට ලියූ අටුවා ග්‍රන්ථ නම් කරන්න.

i. නිද්දේස පාළි

ii. අපදාන පාළි

iii. පටිසම්භිදාමග්ගි

ii. බුද්ධවංස පාළි

(ඉ) පහත සඳහන් වාක්‍යයන්හි තද කළු අකුරින් මුද්‍රිත පදවල උපසර්ග වෙන් කර ලියන්න.

i. කෙවලකප්පං ගිජ්ඣකූටං **ඔභාසෙත්වා** යෙන භගවා තෙනුපසංකමිංසු.

ii. යෙහුයොෳන බො පන භන්තෙ යක්ඛා **අප්පටිවිරතායෙව** පාණාතිපාතා.

iii. තෙ යානෙ **අභිරුහිත්වා** සබ්බා දිසා **අනුපරියන්ති.**

iv. **පච්චෙසන්තො** පකාසෙන්ති තතොලා තත්තලා තතොතලා

v. **නිපජ්ජ** පාදමූලම්හි තං ඨානං අභිපත්ථයිං.

(ලකුණු 2 + 4 + 6 = 12)

08. (අ) පාලි භාෂාව වෙනුවෙන් සුවිශේෂී සේවාවක් කළ අග්‍රගණ්‍ය පාලි පඬිවරු දෙදෙනෙක් නම් කරන්න.

(ආ) උදාන පාළියට අයත් වග්ග අටෙන් හතරක් නම් කරන්න.

(ඉ) සංගාමජී සූත්‍රයේ අන්තර්ගතය කෙටියෙන් ලියන්න.

(ලකුණු 2 + 4 + 6 = 12)

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
**கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு**
**Ministry of Education – Division of Piriven Education**

| 02 | S | I |
|---|---|---|

**වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)**
**வருட இறுதிப் பரீட்சை – 2023 (2024)**
**Year End Test – 2023 (2024)**

පැය එකයි

**(02) පාලි I** **05 ශ්‍රේණිය**

**සැලකිය යුතුයි.**

- ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40 ක්** ලැබේ.
- අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර** තෝරන්න.
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
- මෙම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

01. පාලි භාෂාවේ ඝෝෂාක්ෂර සංඛ්‍යාව,

1. 11 කි.　2. 15 කි.　3. 21 කි.　4. 33 කි.

02. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචන ඇතුළත් වරණය තෝරන්න.

1. චත්තාලීසති, සම්හතං, උච්චාරණ, අනණ
2. චත්තාළීසති, සම්හතං, උච්ඡාරණ, අණන
3. චත්තාලීසති, සම්බතං, උච්චාරණ, අනණ
4. චත්තාළීසති, සම්හතං, උච්චාරණ, අනණ

03. **'ළ'** යනු

1. කණ්ඨජාක්ෂරයකි.　2. මුද්ධජාක්ෂරයකි.
3. දන්තෝට්ඨජාක්ෂරයකි.　4. කණ්ඨෝට්ඨජාක්ෂරයකි.

04. අන්තඃස්ථාක්ෂර ලෙස හඳුන්වනු ලබන්නේ,

1. ය, ර, ල, ව යන අකුරු ය.　2. ඞ, ඤ, ණ, න, ම යන අකුරු ය.
3. ස, හ, ළ, අං යන අකුරු ය.　4. ක, ච, ට, ත, ප යන අකුරු ය.

05. 26 හා 46 යන සංඛ්‍යා නිවැරදි ව පාලියෙන් ප්‍රකාශ කෙරෙන සංඛ්‍යා නාම ඇතුළත් වරණය තෝරන්න.

1. ඡබ්බීසති, පඤ්චපඤ්ඤාසති.　2. ඡබ්බීසති, පඤ්චවීසති.
3. ඡබ්බීසති, ඡපඤ්ඤාසති.　4. ඡබ්බීසති, ඡචත්තාළීසති.

06. **'සම්පදානෙ චතුත්ථී'** යන බාලාවතාර සූත්‍රයට නිදසුන් කළ හැකි පාලි වැකිය තෝරන්න.

1. උපාසකො සංඝස්ස චීවරං දදාති.　2. මනුස්සා චොරා භායන්ති.
3. විහාරෙ භික්ඛුස්ස චීවරං භවති.　4. කුමාරො පාදෙන කන්දුකං පහරති.

07. **'ස'** ප්‍රත්‍යය නාම විභක්ති ප්‍රත්‍යයක් වශයෙන් යෙදෙන විභක්ති දෙක වන්නේ,

1. පඨමා හා ආලපන යි.
2. දුතියා හා චතුත්ථී යි.
3. ඡට්ඨී හා පඤ්චමී යි.
4. චතුත්ථී හා ඡට්ඨී යි.

08. **'මාහිස'** යනු

1. කිතකයකි.
2. සන්ධියකි.
3. සමාසයකි.
4. තද්ධිතයකි.

09. දිගු සමාස පද පමණක් ඇතුළත් වරණය වන්නේ මින් කවරක් ද?

1. විජිතමාරො, චතුප්පදා
2. ගුණධනං, මුනිසීහො
3. වනවාසො, දසසඤ්ඤා
4. තිදණ්ඩං, තිභවා

10. **'විස්සන්දෙන්තො'** යන්නෙහි අර්ථය වන්නේ,

1. ඇතුළට නික්මෙන්නේ ය.
3. පිටතට නික්මෙන්නේ ය.
2. අභ්‍යන්තරයට නික්මෙන්නේ ය.
4. අභිමුඛයට නික්මෙන්නේ ය.

11. නිර්ධාරණාර්ථයෙහි යෙදෙන විභක්ති ඇතුළත් වරණය තෝරන්න.

1. ඡට්ඨී හා චතුත්ථී
2. ඡට්ඨී හා සත්තමී
3. සත්තමී හා චතුත්ථී
4. තතියා හා චතුත්ථී

12. පාලි භාෂාවේ සමාස ගණන,

1. හතරකි.
2. පහකි.
3. හයකි.
4. හතකි.

13. ධාතුවක් අගට ප්‍රත්‍යය එකතු කිරීමෙන් සාදාගනු ලබන්නේ,

1. තද්ධිත පද යි.
2. ආඛ්‍යාත පද යි.
3. ආඛ්‍යාත හා කිතක පද යි.
4. කිතක පද යි.

14. "භගවතො ................. මහාපුරිස ලක්ඛණා හොන්ති" යන වැකියෙහි හිස්තැනට වඩාත් උචිත පදය කුමක් ද?

1. සහස්සං
2. අසීති
3. ද්වත්තිංස
4. චතුරාසීති

15. "මව කෑ යුතු පූත භෝජන ගෙනාවා ය" යන අර්ථය දෙන පාලි වාක්‍යය තෝරන්න.

1. මාතා ඛාදනීයං භොජනං ආනෙසි.
2. මාතා ඛාදනීයං පූතං භොජනං ආනෙසිං.
3. මාතා ඛාදනීයානි පූතං භොජනං ආනෙසි.
4. මාතා ඛාදනීයං පූතං භොජනං ආනෙසි.

16. **"ථෙරා නවහි මාසෙහි සංගීතිං අකංසු"** යන වැකියෙහි විභක්ති ප්‍රයෝගය වන්නේ,

1. ක්‍රියා ප්‍රවර්ගාර්ථයේ තතියා විභක්තිය යි.
2. සහාදි යෝගයේ තතියා විභක්තිය යි.
3. කරණාර්ථයේ තතියා විභක්තිය යි.
4. ක්‍රියා විශේෂණාර්ථයේ තතියා විභක්තිය යි.

17. ආඛ්‍යාත පදයක ලක්ෂණ සම්බන්ධයෙන් **සාවද්‍ය ප්‍රකාශය** ඇතුළත් වරණය වන්නේ මින් කුමක් ද?

1. වර්තමාන, අතීත, අනාගත යනුවෙන් කාල තුනක් ඇත.
2. පඨම පුරිස, මජ්ඣිම පුරිස, උත්තම පුරිස යනුවෙන් පුරිෂත්‍රයක් ඇත.
3. කත්තුකාරක, කම්මකාරක, භාවකාරක යනුවෙන් කාරකත්‍රයක් ඇත.
4. පුරිසලිංග, ඉත්ථිලිංග, නපුංසකලිංග යනුවෙන් ලිංගත්‍රයක් ඇත.

18. පඤ්චමී ආඛ්‍යාත පදයක් නො යෙදුණු පාලි වාක්‍යය තෝරන්න.

1. නික්ඛම සමණ පවිස සමණ.
2. අහං අවෙරො භවච්හො.
3. දෙවො වස්සතු කාලෙන.
4. න භජෙ පාපකෙ මිත්තෙ.

19. අර්ථයෙන් **සමාන නොවන** නිපාත යුගලය තෝරන්න.

1. සචෙ - චෙ 2. නූන - හවෙ 3. යාව - යාවතා 4. විනා - රිතෙ

20. අසවර්ණාදේශ රීතිය මගින් සන්ධි වූ පද සහිත වරණය කුමක් ද?

1. තම්මිත්තං, කිංසූධ, යථරිව
2. බන්ධුස්සෙව, නොපෙති, චන්දොදය
3. ලොකග්ගො, ඉදහික්ඛවෙ, තස්මාතිහ
4. ඉදාහං, ඔනද්ධා, එතදවොච

21. **"සරා සරෙ ලොපං"** යන බාලාවතාර සූත්‍ර පාඨයෙන් ප්‍රකාශ වන්නේ,

1. පූර්ව ස්වරය ලොප් වන බව යි.
2. පූර්ව ස්වරය දීර්ඝ වන බව යි.
3. පර ස්වරය ලොප් වන බව යි.
4. පර ස්වරය දීර්ඝ වන බව යි.

22. **'පච්චත්තං'** යන්නෙහි නිවැරදි විසන්ධිය වන්නේ,

1. පච්ච + අත්තං ය.
2. පච්ච + ත්තං ය.
3. පති + ච + ත්තං ය.
4. පති + අත්තං ය.

23. උදානපාළියේ වර්ග සංඛ්‍යාව,

1. 08 කි. 2. 09 කි. 3. 10 කි. 4. 12 කි.

➢ **අංක 24 සිට 26 තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළ ව වඩාත් ම සුදුසු පිළිතුර තෝරන්න.**

24. A. සමන්තපාසාදිකා . B. සුමංගලවිලාසිනි C. මනෝරථපූරණී D. අත්ථසාලිනී

ඉහත සඳහන් ඒවායින් බුද්ධඝෝෂ හිමියන් දීඝනිකායට හා ධම්මසංගණී ප්‍රකරණයට සම්පාදනය කළ අටුවා යුගලය තෝරන්න.

1. A සහ B ය. 2. B සහ C ය. 3. B සහ D ය. 4. C සහ D ය.

25. A. බෝධි වග්ගය B. ඛත්තියා වග්ගය C. මුචලින්ද වග්ගය
D. නන්ද වග්ගය E. චූල වග්ගය

ඉහත සඳහන් ඒවායින් උදානපාළියට අයත් වර්ග හතර තෝරන්න.

1. A, B, C, E ය. 2. A, C, D, E ය. 3. B, A, E, D ය. 4. A, B, C, D ය.

26. A. පාලි භාෂාවතරණය B. පාලි සිංහල අකාරාදිය C. ථෙරවාද බෞද්ධාචාර්යයෝ
D. බෞද්ධ භාරතය E. පාලි සාහිත්‍යය

ඉහත සඳහන් ඒවායින් පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ වන්නේ,

1. A, B, C, D ය. 2. A, B, C, E ය. 3. A, C, D, E ය. 4. B, C, D, E ය.

27. මුලින් සඳහන් ව්‍යාකරණ අංගයට **අයත් නොවන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

1. ආඛ්‍යාත - අකා, ජගාම, ආසිං, අජ්ඣා, වසිස්සා
2. පූර්ව ක්‍රියා - දිස්වා, ආරුය්හ, ගන්ත්වාන, පග්ගය්හ
3. තුමන්ත ක්‍රියා - තික්ඛත්තුං, ගන්තුං, දක්ඛිතායෙ, සොතවෙ
4. ප්‍රයෝජ්‍ය ක්‍රියා - කාරෙසි, වාචයති, කසාපෙති, කාරාපයති

28. කිතක පදයක් සාදා ගන්නේ,

1. නාම පදයකට ප්‍රත්‍යයක් එක් කිරීමෙනි. 2. ධාතුවකට ප්‍රත්‍යයක් එක් කිරීමෙනි.

3. ආඛ්‍යාත පදයකට ප්‍රත්‍යයක් එක් කිරීමෙනි. 4. නාමයකට ප්‍රත්‍යයක් එක් කිරීමෙනි.

29. කාලාර්ථයක් ප්‍රකාශ වන නිපාත පදය කුමක් ද?

1. සුවෙ 2. ආවි 3. ඉතො 4. වත

30. භාව තද්ධිතයට අයත් පදයක් වන්නේ,

1. මානව යන්න යි. 2. සාකටික යන්න යි.
3. ලහුතා යන්න යි. 4. ගුණවන්තු යන්න යි.

31. **"අහං රුක්ඛං ඡින්දාමි"** යන්නෙහි කර්ම කාරක වාක්‍යය වන්නේ,

1. මයා රුක්ඛො ඡින්දියතෙ යන්න යි. 2. අහං රුක්ඛො ඡින්දියතෙ යන්න යි.
3. මයා රුක්ඛං ඡින්දාමි යන්න යි. 4. අහං රුක්ඛං ඡින්දියතෙ යන්න යි.

32. **"බ්‍රහ්මබන්ධු පුරෙ ආසිං"** මෙම වාක්‍යයෙහි ක්‍රියා පදය අයත් වන්නේ,

1. අජ්ජතනී ආඛ්‍යාතයට ය. 2. පරොක්ඛා ආඛ්‍යාතයට ය.
3. කාලාතිපත්ති ආඛ්‍යාතයට ය. 4. භවිස්සන්ති ආඛ්‍යාතයට ය.

33. රීස් ඩේවිඩ්ස් පඬිතුමා විසින් පළමුවෙන් රචනා කරන ලද කෘතිය ලෙස සැලකෙන්නේ,

1. බුද්ධ ධර්ම සංග්‍රහය ග්‍රන්ථය යි. 2. ලංකාවේ පැරණි කාසි හා මැනීම් ක්‍රම ග්‍රන්ථය යි.
3. බෞද්ධ ජාතක කථා ග්‍රන්ථය යි. 4. බෞද්ධ සූත්‍ර ග්‍රන්ථය යි.

34. පාලි මහාබෝධි වංසයේ කතුවරයා වන්නේ,

1. උපතිස්ස තෙරුන් ය. 2. වාචිස්සර තෙරුන් ය.
3. දාඨානාග තෙරුන් ය. 4. රාජගුරු ධර්මකීර්ති තෙරුන් ය.

35. **'මුවන් මරන්නා'** යන තේරුම ඇති තද්ධිත පදය කුමක් ද?

1. මාගවියික 2. මාගනෙය්‍ය 3. මාගවික 4. මාගතෙය්‍ය

36. අව්‍යයීභාව සමාස පද පමණක් ඇතුළත් වරණය කුමක් ද?

1. අසුරො - බ්‍රාහ්මණො 2. පටිවාතං - යථාබලං

3. කාපුරිසො - සප්පුරිසො 4. පාවචනං - ජිනචරිතං

37. පාලි භාෂාවේ තද්ධිත ප්‍රභේද ගණන,

1. 05 කි. 2. 06 කි. 3. 08 කි. 4. 10 කි.

38. **මාතුච්ඡා** යන්නෙහි අර්ථය වන්නේ,

1. සුළු මව ය. 2. නැන්දම්මා ය. 3. මව ය. 4. අත්තම්මා ය.

39. 'කිම්දං .......... නාම පීතිවෙගසමුට්ඨාපිතො ..........' යන වාක්‍යයෙහි හිස්තැන්වලට පිළිවෙළින් අයත් වන්නේ,

1. උදානං - උදෙති 2. බො - උදානං

3. උදාහාරො - උදානං 4. උදානං - උදාහාරො

40. අතීත කෘදන්ත පද පමණක් ඇති වරණය තෝරන්න.

1. දිනකර, කිච්ච, පත්ත 2. භුත්ත, කාරිය, රථකාර

3. පත්ත, යුත්ත, යුද්ධ 4. යුත්ත, නායක, දායක

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

| 02 | S | II |
|---|---|---|

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
**கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு**
**Ministry of Education – Division of Piriven Education**

**වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)**
**வருட இறுதிப் பரீட்சை – 2023 (2024)**
**Year End Test – 2023 (2024)**

පැය තුනයි

**(02) පාලි II** **05 ශ්‍රේණිය**

අමතර කියවීම් කාලය - **මිනිත්තු 10 යි.** අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛතාව දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

- **සැලකිය යුතුයි.**
  I කොටසේ ප්‍රශ්න **දෙක ද,** II කොටසින් **ප්‍රශ්න තුනක් ද** තෝරාගෙන ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

**I කොටස**

01. (අ) **සිංහලට** නගන්න.

'එවමාවුසො'ති බො ආයස්මා නන්දො තස්ස භික්ඛුනො පටිස්සුත්වා යෙන භගවා තෙනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං බො ආයස්මන්තං නන්දං භගවා එතදවොච; සච්චං කිර ත්වං නන්ද, සම්බහුලානං භික්ඛූනං එවමාරොචෙසි 'අනභිරතො අහං ආවුසො බ්‍රහ්මචරියං චරාමි. න සක්කොමි බ්‍රහ්මචරියං සන්ධාරෙතුං. සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සාමී'ති. එවං භන්තෙ'ති. "කිස්ස පන ත්වං නන්ද, අනභිරතො බ්‍රහ්මචරියං චරසි? න සක්කොසි බ්‍රහ්මචරියං සන්ධාරෙතුං සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සසී? ති. "සාකියානී මං භන්තෙ ජනපදකල්‍යාණී ඝරා නික්ඛමන්තස්ස උපඩ්ඪුල්ලිඛිතෙහි කෙසෙහි අපලොකෙත්වා මං එතදවොචඃ 'තුවටං බො අය්‍යපුත්ත; ආගච්ඡෙය්‍යාසී'ති. සො බො අහං භන්තෙ තමනුස්සරමානො අනභිරතො බ්‍රහ්මචරියං චරාමි. න සක්කොමි බ්‍රහ්මචරියං සන්ධාරෙතුං. සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සාමී"ති. (ලකුණු 6)

(ආ) **සිංහලට** නගන්න.

i. තථෛවාධිපතෙය්‍යෙන අධිගය්හ විරොච'හං,
අහොසිං අමරින්දස්ස මහෙසී දයිතා තහිං.

ii. සංසාරෙ සංසරන්තීහං කම්මවායුසමෙරිතා,
කාසිස්ස රඤ්ඤො විසයෙ ආජායිං දාසගාමකෙ.

iii. පඤ්චදාසසතා'නූනා නිවසන්ති තහිං තදා,
සබ්බෙසං තත්ථ යො ජෙට්ඨො තස්සා ජායා අහොස'හං. (ලකුණු 6)

02. (අ) **පාලියට** නගන්න.

i. මහණෙනි, වස් එළඹෙන්නට අනුදනිමි.

ii. පවිටු මිතුරන් ඇසුරු නොකරන්නේ නම් මැනවි.

iii. සත්පුරුෂයෝ නිතර විහාරයට යති. (ලකුණු 2 x 3 = 6)

(ආ) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සබ්‍රහ්මකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. සපුබ්බදෙවතානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. සපුබ්බාචරියකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. සාහුණෙය්‍යකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. බ්‍රහ්මාති භික්ඛවෙ මාතාපිතුනං එතං අධිවචනං. පුබ්බදෙවතානි භික්ඛවෙ මාතාපිතුනං එතං අධිවචනං. පුබ්බාචරියාති භික්ඛවෙ මාතාපිතුනං එතං අධිවචනං. ආහුණෙය්‍යාති භික්ඛවෙ මාතාපිතුනං එතං අධිවචනං. තං කිස්ස හෙතු? බහූපකාරා භික්ඛවෙ මාතාපිතරො පුත්තානං, ආපාදකා පොසකා ඉමස්ස ලොකස්ස දස්සෙතාරොති.

(අ) "අජ්ඣාගාරෙ " මෙහි අර්ථය ලියන්න.
(ආ) ආහුණෙය්‍ය ගුණය පහදන්න.
(ඉ) දෙමව්පියන් හැඳින්වීමට යොදා ඇති පර්යාය වචන දෙකක් දක්වන්න.
(ඊ) දෙමව්පියන් දරුවන්ට දක්වන උපකාර දෙකක් ලියා දක්වන්න.

(ලකුණු 1 + 1 + 2 + 2 = 6)

## II කොටස

03. i. වර්ගාක්ෂර පිළිබඳ ඉගැන්වෙන බාලාවතාර සූත්‍ර පාඨය නිවැරදි ව ලියන්න. (ලකුණු 2)

ii. පාලි නාම විභක්ති ප්‍රත්‍යය මාලාව පිළිවෙළින් ලියන්න. (ලකුණු 4)

iii. පහත සඳහන් සන්ධි පද විසන්ධි කරන්න.

| | |
|---|---|
| i. යානීධ | ii. ඡායාව |
| iii. ඡළභිඤ්ඤා | iv. එසධම්මො |
| v. සෙතච්ඡත්තං | vi. සඤ්ජාතො |
| vii. ඉදමවොච | viii. බීජංව |
| ix. සබ්බෙව | x. පුනරෙව |
| xi. චන්දොදය | xii. මාතුපට්ඨානං |

(ලකුණු 6)

04. i. **'සම්පදානෙ චතුත්ථී'** යන සූත්‍රයේ අර්ථය ලියා උදාහරණයක් සපයන්න. (ලකුණු 2)

ii. තද කළු අකුරින් මුද්‍රිත නාම පදයන්හි විභක්තිය හා වචනය ලියන්න.

(අ) **පුත්ත** ඉහාගච්ඡ.
(ආ) දාරකො **මඤ්චෙ** සයති.
(ඉ) සො **පාදෙන** කන්දුකං පහරති.
(ඊ) **සමණස්ස** සච්චං රොචතෙ. (ලකුණු 4)

iii. පහත දැක්වෙන ක්‍රියා පදවල ආඛ්‍යාත විභක්ති නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| i. අභවි | ii. අට්ඨාසි | iii. යාති | |
| iv. පූජෙය්‍යාසි | v. කරිස්සාම | vi. මොදති | |
| vii. වන්දෙය්‍ය | viii. අගච්ඡා | ix. දදිංසු | |
| x. භවන්තු | xi. ජීරති | xii. ආහරිස්සති | (ලකුණු 6) |

05. i. **'නාමානං සමාසො යුත්තත්ථො'** යන්නෙහි අර්ථය ලියා උදාහරණයක් සපයන්න.

(ලකුණු 2)

ii. පහත සඳහන් තද්ධිත පදවල අර්ථ ලියන්න.

(අ) කායික, (ආ) සාකටිකො,

(ඉ) වෙනයික, (ඊ) පාපිය,

(ලකුණු 4)

iii. පහත සඳහන් සමාස පද කුමන සමාසයට අයත් දැයි දක්වන්න.

| | | |
|---|---|---|
| (i) මහාපුරිසො | (ii) චතුමාසං | (iii) රාජපුත්තො |
| (iv) ආරුළ්හවාණිජා | (v) යාවජීවං | (vi) ඩංසමකසං |
| (vii) සාරිපුත්තත්ථෙරො | (viii) ජීවිතින්ද්‍රියො | (ix) කාපුරිසො |
| (x) තිලොකං | (xi) අනුරථං | (xii) ජිනචරිතං |

(ලකුණු 6)

06. i. පහත සඳහන් සංඛ්‍යා පාලියෙන් ලියන්න.

(අ) 25 (ආ) 49

(ඉ) 99 (ඊ) 108

(ලකුණු 2)

ii. පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

(අ) චොරො ගොණං චොරෙති.

(ආ) දාසො සුනඛං හරති.

(ඉ) මයං පොත්ථකෙ පඨාම.

(ඊ) කුමාරා අම්හෙ පහරන්ති.

(ලකුණු 4)

iii. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වාක්‍ය හයකට නො අඩු පාලි රචනාවක් ලියන්න.

(අ) සම්මා සම්බුද්ධො

(ආ) මම මාතා

(ඉ) අනුරාධපුරං

(ලකුණු 6)

07. i. පහත සඳහන් නිපාත පදවල අර්ථ ලියා දක්වන්න.

(අ) ඊසකං (ආ) සනිකං

(ඉ) වෙ (ඊ) අලිකං

(ලකුණු 2)

ii. පහත සඳහන් පදවල උපසර්ග පද වෙන්කර ලියන්න.

(අ) අභිවන්දති (ආ) ආහරති

(ඉ) නිවාරෙති (ඊ) පරිහරති

(ලකුණු 4)

iii. පහත සඳහන් නිපාත පද සුදුසු පරිදි යොදා හිස්තැන් පුරවා වාක්‍ය නැවත ලියන්න.

(අභිණ්හං, ඛිප්පං, පුනප්පුනං, කච්චි, දිවා, තදා)

(අ) ආදිච්චො ...................................... තපති.

(ආ) කස්සකා ...................................... බීජානි වපන්ති.

(ඉ) ...................................... තෙ කස්සප ඛමනීයං.

(ඊ) පණ්ඩිතො ...................................... ධම්මං විජානාති.

(උ) පබ්බජිතෙන ...................................... පච්චවෙක්ඛිතබ්බං.

(ඌ) භූමිචාලො ...................................... ආසි.

(ලකුණු 6)

08. i. උදානපාළියේ අට්ඨකථාව හා එහි කතුවරයා නම් කරන්න.

(ලකුණු 2)

ii. උදානපාළියේ වග්ග අට නම් කරන්න.

(ලකුණු 4)

iii. ගබ්භිනී සූත්‍රයෙහි සාරාංශය ලියා දක්වන්න.

(ලකුණු 6)